# පටුන


1. තිරසර සංචාරක ව්‍යාපාරයේ පසුබිම ........ 2

2. තිරසර සංචාරක සේවා සහතිකකරණය ........ 3

3. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණය පිළිබඳ (NSTC) හැඳින්වීම ........ 10

4. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණයේ ප්‍රතිලාභ ........ 11

5. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණයේ අපේක්ෂිත ප්‍රතිඵල ........ 12

6. ගෝලීය තිරසර සංචාරක කවුන්සිලය (GSTC) ........ 13

7. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණය සඳහා අයදුම් කිරීම ........ 14

7.1. සහතිකකරණය සඳහා ඉල්ලුම් කළ හැක්කේ කාටද? ........ 14

7.2. සහතික කරවා ගන්නේ කෙසේද? ........ 14

7.2.1. සහතිකකරණ සඳහා අයදුම් කිරීම ........ 14

7.2.2. අයදුම්පත්/ලේඛන ගත සාක්ෂි SLTDA (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ........ 14

7.2.3. සමාලෝචන (ඩෙස්ක්ටොප්) තක්සේරුව සහ අදහස් විමසීම ........ 14

7.2.4. ස්ථානීය විගණනය ........ 14

7.2.5. විගණන වාර්තා ........ 14

7.2.6. සහතිකය නිකුත් කිරීම ........ 14

7.2.7. සහතිකය අලුත් කිරීම ........ 14

8. තිරසර සංචාරක සේවා සහතිකකරණයෙහි ක්‍රියාවලිය ........ 15

9. සහතිකකරණය ලබා ගැනීම සඳහා සූදානම් වන්නේ කෙසේද? ........ 16

10. ලේඛන සහ අනෙකුත් සාක්ෂි සැකසීම/ඉදිරිපත් කිරීම සඳහා ස්වයං-පරීක්ෂණ ලැයිස්තුව ........ 17

11. ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය ........ 28

12. වලංගුභාවය සහ අලුත් කිරීම ........ 29

තොරතුරු මූලාශ්‍ර ........ 30

# 1. තිරසර සංචාරක ව්‍යාපාරයේ පසුබිම

සංචාරකයින් සංඛ්‍යාව ඉහළ යාමත් සමඟ සංචාරක ව්‍යාපාරය බොහෝ ආර්ථිකයන්හි ඉතා වැදගත් අංගයක් බවට පත්ව ඇත. මෙම ව්‍යාපාරයට බොහෝ ප්‍රතිලාභ සහ අවස්ථා ලබා දීමේ හැකියාව තිබෙන නමුදු එය තුළින් සෘණාත්මක ප්‍රතිවිපාක ඇති වීම වළක්වා ගැනීම සඳහා එය තිරසරව කළමනාකරණය කිරීම වැදගත් වේ. සංචාරක ව්‍යාපාරය ප්‍රවේශම් සහගත අයුරින් සැලසුම් නොකරනු ලබන්නේ නම් එය යම් සම්පත් මත රඳා පවතින්නේ ද එම සම්පත් විනාශයට පත්වනවා මෙන්ම සමාජ හා පාරිසරික විනාශයට ද එය හේතු පාදක විය හැකිය. මෙම සෘණාත්මක ප්‍රතිවිපාක වළක්වා ගැනීම සඳහා සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ දී එහි තිරසරභාවයට ප්‍රමුඛත්වය දීම වැදගත් වේ.

තිරසර සංචාරක සංකල්පය නම් වූ මෙම සංකල්පය මෑත වසරවලදී සැලකිය යුතු අවධානයක් දිනා ගෙන ඇති අතර එය මේ වන විට ජාතික සහ ජාත්‍යන්තර සංචාරක ප්‍රතිපත්තිවල අත්‍යවශ්‍ය අංගයක් බවට ද පත් වී තිබේ. තිරසර සංචාරක ව්‍යාපාරය යනු වර්තමානයේ සහ අනාගතයේදී සංචාරක ව්‍යාපාරයේ ආර්ථික, සමාජීය සහ පාරිසරික බලපෑම් පිළිබඳ සැලකිල්ලට භාජනය කරන්නාවූ ව්‍යුහයකින් යුක්ත සංචාරක ව්‍යාපාර මාදිලියකි. එහි අරමුණ වනුයේ සංචාරකයින්, සංචාරක කර්මාන්තය, පරිසරය සහ සත්කාරක ප්‍රජාවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර සංචාරක ව්‍යාපාරය විසින් ස්වභාවික සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීම, සත්කාරක ප්‍රජාවන්ට ගරු කිරීම සහ දිගුකාලීන ආර්ථික ශක්‍යතාව සහතික කිරීම, මෙකී කාර්ය හා සම්බන්ධ සියලු පාර්ශවයන් අතර සාධාරණ ලෙස ප්‍රතිලාභ බෙදා හැරීම යනාදිය සිදු කළ යුතුය. (සංචාරක ව්‍යාපාරය වඩාත් තිරසර බවට පත් කිරීම - ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මාර්ගෝපදේශයක්, UNEP සහ UNWTO '2005' සංචාරක ව්‍යාපාරයට ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරීමට සහ පරිසරය ආරක්ෂා කිරීමට හැකියාව ඇති අතර තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) 17න් ඉලක්ක තුනක මේ පිලිබඳ සඳහන් වේ: එනම්, ආර්ථික වර්ධනය, යහපත් රැකියා සහ තිරසර නිෂ්පාදනය සහ පරිභෝජනය යනාදිය තුළ මෙසේ සටහන් වී තිබේ. ඊට අමතරව, එය සාගර සංරක්ෂණය හා තිරසර භාවිතයට ද සම්බන්ධ වේ. එබැවින් සංචාරක ව්‍යාපාරය වැදගත් ගෝලීය ඉලක්ක රාශියක් සාක්ෂාත් කර ගැනීමට දායක විය හැකි ප්‍රධාන ව්‍යාපාරයකි.

ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව සමතුලිත කිරීමට උත්සාහ කරන තිරසර සංවර්ධනය, 1992 රියෝ පෘථිවි සමුළුවේ සිට දැඩි ලෙස අවධානයට යොමු වන මාතෘකාවක් බවට පත් වී තිබේ. තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) යනු වඩාත් තිරසර අනාගතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සැකසුණු නිශ්චිත ගෝලීය සැලැස්මකි. 2017 දී ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන පනත සම්මත කර ගත් අතර, එමඟින් සියළු අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් සියලු කර්මාන්ත සහ රජයේ වැඩසටහන් සඳහා තිරසර සංවර්ධන උපාය මාර්ගයක් සකසා ගත යුතු විය. සංචාරක ව්‍යාපාරය දිගු කලක් තිස්සේ ශ්‍රී ලංකාවේ තිරසර කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක වන අතර සංචාරක උපායශීලී සැලැස්ම 2017-2020 තුළ එහි ප්‍රධාන උපාය මාර්ගවලට තිරසරභාවය ඇතුළත් කර තිබේ. සංචාරක කර්මාන්තයේ දී පෞද්ගලික අංශය ද තිරසරභාවය පවත්වා ගැනීම සඳහා පියවර ගෙන ඇති අතර, බොහෝ හෝටල් ඔවුන්ගේ තිරසර භාවිතයන් සඳහා Travelife, Earth Check, US Green Building Council LEED, Green Globe වැනි ජාත්‍යන්තර සම්මාන සහ සහතික ලබා ගෙන ඇත. Bookdifferent.com වැනි තිරසර සංචාරක විකල්ප ප්‍රවර්ධනය කරන මාර්ගගත සංචාරක වේදිකා වෙත පාරිභෝගිකයින් වැඩි වැඩියෙන් යොමු වීම තුළින් පැහැදිලිව පෙනී යන්නේ මිහිතලයට, මිනිසුන්ට සහ සංස්කෘතීන්ට සහාය වන චාරිකා සඳහා වැයකිරීමට ඔවුන් තුළ කැමැත්තක් ඇති බවයි.



# 2. තිරසර සංචාරක සේවා සහතිකකරණය

සහතිකකරණය (සහතික කිරීම) ගමනාන්තයක තිරසර බව වැඩි දියුණු කිරීම සඳහා වන එක් මාර්ගයකි. සහතිකකරණ ක්‍රම මගින් ප්‍රමිතීන් ස්ථාපිත කරන අතර අව්‍යාජ තිරසර සංචාරක ව්‍යාපාර අන් ව්‍යාපාරයන්ගෙන් වෙන්කර හඳුනා ගැනීම සඳහා අලෙවිකරණය සහ ප්‍රවර්ධන සඳහා භාවිත කළ හැකි ගුණාත්මක සලකුණක්, ලේබලයක් හෝ ලාංඡනයක් ඒමගින් සැපයේ. ගෝලීය වශයෙන් සහතික කිරීමේ යෝජනා ක්‍රම 150 කට අධික ප්‍රමාණයක් ඇති අතර ඒවායින් සමහරක් ක්‍රම අනෙක් ඒවාට වඩා ප්‍රසිද්ධයක් උසුලයි. සහතිකකරණය ගමනාන්තයක තිරසර ප්‍රමිතීන් ඉහළ නැංවීමට උපකාරී වන අතර එය පාරිසරික හා සමාජීය හැඟීමකින් යුක්ත සංචාරකයින්ට එම ගමනාත්තය වඩාත් ආකර්ශනීය ස්ථානයක් බවට පත් කරයි.

සමහරක් ව්‍යාපාර සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ඔවුන්ගේ තිරසර පිළිවෙත් පිළිබඳ ව්‍යාජ හෝ නොමඟ යවන ප්‍රකාශයන් සිදු කරන අතර  එය මෙම ක්ෂේත්‍රය තුළ "greenwashing" (හරිත සේදීම) ලෙස හැඳින්වේ. මෙකී උත්සාහයන් කරණ කොට ගෙන සේවාලාභීන්ට සැබෑ තිරසර ව්‍යාපාර හඳුනා ගැනීමට අපහසුක් ඇති වේ. යම් ව්‍යාපාරයක් අවම තිරසර ප්‍රමිතීන් සපුරා ඇති බවට ඒකී ව්‍යාපාරයට සහ පාරිභෝගිකයින්ට සහතිකයක් ලබා දීමෙන් මෙම ගැටලුව විසඳීමට සහතිකකරණය උපකාරී වේ. සහතිකරණය සඳහා, ව්‍යාපාරයක් සාමාන්‍යයෙන් සහතික කිරීමේ නියෝජිතායතනයට ගාස්තුවක් ගෙවිය යුතු අතර, ලේඛන සහ ප්‍රශ්නාවලි කිහිපයක් සම්පූර්ණ කොට විගණකවරයෙකු විසින් පරීක්ෂණයකට සහ ඇගයීමකට ලක් කර ගත යුතුය. යම් ව්‍යාපාරයක් අවශ්‍ය ප්‍රමිතීන් සපුරාලන්නේ නම්, එය සහතිකකරණයට ලක්වූ නැතහොත් සහතික කළ ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන අතර සහතික කිරීමේ නියෝජිතායතනයේ ලාංඡනය තම ව්‍යාපාර කටයුතු සඳහා  භාවිතා කළ හැක. තිරසර සංචාරක සහතික කිරීම යුරෝපයේ බහුලව දක්නට ලැබෙන අතර බොහෝ විට නවාතැන් අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. ඉහත සහතිකකරණ ක්‍රියාවලිය හරිත සේදීම නැවැත්වීමට උපකාරී වන අතර පාරිභෝගිකයින්ට ඔවුන් අනුග්‍රහය දක්වන ව්‍යාපාර තිරසරභාවය සඳහා අවංකවම කැපවී සිටින බවට විශ්වාසයක් ලබා දෙයි. සංචාරක කර්මාන්තයේ තිරසර භාවිතයන් සඳහා කැපවීමක් පෙන්නුම් කිරීමට භාවිතා කළ හැකි තිරසර සංචාරක ව්‍යාපාරය සඳහා බහුලව භාවිතා වන සහතිකකරණ කිහිපයක් තිබේ. මෙම සහතිකකරණයන්ට පහත දක්වා ඇති සහතිකකරණ ඇතුළත් වේ.

## Green Globe Certification

Green Globe certifies hotels, resorts, tour operators, car rentals, exhibition centres and other tourism companies.

| | |
|---|---|
| Internet | www.greenglobe.com |
| Certifying Organisation | Green Globe |
| Partner Organisation/s | TSC, EVVC, GCB, Atmosfair, emendo 4, World Travel & Tourism Council, Obmi, Bisa spa, Pata, UNWTO, Skal |
| Scope | International, 83 Countries |
| Certified Businesses | 300 |
| Sustainability Areas | Environment, Social Issues, Economy, Cultural Heritage |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification every 2 years |

## The Green Key

The Green Key is awarded to hotels, campgrounds and attractions. The leading organisation also awards the international "Blue Flag label" to beaches and marinas.

| | |
|---|---|
| Internet | www.green-key.org |
| Certifying Organisation | Foundation of Environmental Education (FEE) |
| Partner Organisation/s | UNEP, UNWTO |
| Scope | International, 28 Countries |
| Certified Businesses | 1539 |
| Sustainability Areas | Environment |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification every 3 years |

## EarthCheck

The EarthCheck certification programme focuses on environmental management for the travel and tourism industry and also assists the businesses in their cost and risk management.

| | |
|---|---|
| Internet | www.earthcheck.org |
| Certifying Organisation | EC3 Global |
| Partner Organisation/s | Ecolab, Travelocity, Useeka, Expedia, SAI Global, Rainforest Alliance, Singapore Polytechnic, Greenfleet, WWF, GRI, GSTC, PATA and other organizations |
| Scope | International, 70 Countries |
| Certified Businesses | Over 700 |
| Sustainability Areas | Environment, Social Issues, Cultural Heritage |
| Transparency | Standard only available for members |
| Verification Procedure | On-site third-party verification every year |

## Travelife Awards

Travelife works with major international and small independent tour operators from different countries. Participating hotels and apartment buildings can attain the certification levels bronze, silver or gold. The system is currently developing a travel companies' certificate.

| | |
|---|---|
| Internet | www.travelife.org |
| Certifying Organisation | ABTA Ltd. |
| Partner Organisation/s | Over 15 travel associations, mostly in Great Britain, Scandinavia, The Netherlands, Germany, Brazil and Thailand |
| Scope | International, 36 Countries |
| Certified Businesses | 500 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard published |
| Verification Procedure | On-site verification every 2 years (as of 2012 by third-party auditors) |

## European Ecolabel

In the field of tourism, the official European Union label is awarded to accommodation establishments and campsites. The verification process and assignment of the certificate is performed by the national partner organisations, e. g. environmental ministries.

| | |
|---|---|
| Internet | www.ec.europa.eu/environment/ ecolabel |
| Certifying Organisation | European Commission |
| Partner Organisation/s | Environmental Ministries of the EU Members States |
| Scope | Europe |
| Certified Businesses | 506 |
| Sustainability Areas | Environment |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification every 3–5 years |

## Blaue Schwalbe

The Blaue Schwalbe was the first eco-label for tourist accommodations worldwide. It was created in 1989 and certifies ecologically-oriented hotels, guesthouses, inns and camping sites in Europe. Most Blaue Schwalbe accommodations are located in travel areas that can be easily reached without air transport or private cars.

| | |
|---|---|
| **Internet** | www.vertraeglich-reisen.de/biohotels |
| **Certifying Organisation** | Fairkehr GmbH |
| **Partner Organisation/s** | Cooperation established inter alia with Austrian Ecolabel for Tourism, Steinbock Label, BIO Hotels |
| **Scope** | Europe, 10 Countries |
| **Certified Businesses** | Around 150 |
| **Sustainability Areas** | Environment, Social Issues, Economy |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | Desk-top reviews and first-party verification |

## Österreichisches Umweltzeichen :: Tourismus

The Austrian Ecolabel was the first national eco-label for tourism worldwide. The label was introduced in 1996 for hotels and restaurants and since 2008, it has also been applied to travel packages in Austria and other countries.

| | |
|---|---|
| **Internet** | www.umweltzeichen.at |
| **Certifying Organisation** | Austrian Federal Ministry for Agriculture, Forestry, Environment and Water Management (BMLFUW) |
| **Partner Organisation/s** | Austrian Consumer Association (VKI) |
| **Scope** | Austria |
| **Certified Businesses** | Around 220 |
| **Sustainability Areas** | Environment |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | On-site third-party verification every 4 years |

## Viabono

Viabono was established in 2001 as an initiative of the German Federal Ministry for the Environment and the Federal Environmental Agency. The certificate is awarded to hotels, apartments, conference centres, campgrounds, hostels, restaurants, holiday packages as well as canoe rental services, nature parks and tourism municipalities.

| | |
|---|---|
| **Internet** | www.viabono.de |
| **Certifying Organisation** | Viabono GmbH |
| **Partner Organisation/s** | BMU, BMWi, UBA, BfN |
| **Scope** | Germany |
| **Certified Businesses** | 300 |
| **Sustainability Areas** | Environment, Economy |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | Desk-top reviews and first-party verification |

## Steinbock-Label

The Steinbock-Label is awarded to hotels and hostels, youth hostels and convention centres. As of 2012, it operates under the label „Ibex - fair stay" and is awarded at three levels (bronze, silver & gold). An extension to Austria, South Tyrol and Germany is planned.

| | |
|---|---|
| **Internet** | www.steinbock-label.ch |
| **Certifying Organisation** | Steinbock-Label |
| **Partner Organisation/s** | – |
| **Scope** | Switzerland, Liechtenstein |
| **Certified Businesses** | 58 |
| **Sustainability Areas** | Environment, Social Issues, Economy |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | On-site third-party verification every 2–3 years |

## Green Tourism Business Scheme (GTBS)

| | |
|---|---|
| GTBS is officially recognised by all the national tourism offices in Ireland and Great Britain. The certificate is awarded in bronze, silver or gold to all types of accommodation, restaurants, attractions, offices, conferences and event venues, tour operators, boats and shops. | |
| **Internet** | www.green-business.co.uk |
| **Certifying Organisation** | Green Business UK Ltd. |
| **Partner Organisation/s** | Shetland Environmental Agency Ltd. |
| **Scope** | Great Britain, Ireland |
| **Certified Businesses** | 2231 (awaiting grading, bronze, silver, gold) |
| **Sustainability Areas** | Environment, Social Issues, Cultural Heritage |
| **Transparency** | Standard partially published |
| **Verification Procedure** | On-site third-party verification every 2 years |

## Legambiente Turismo

| | |
|---|---|
| The environmental association Legambiente closely cooperates with the tourism destinations in Italy, coordinating the criteria together with them. Travellers can view the services offered by certified hotels, campsites, guesthouses and agro-tourism farms online. | |
| **Internet** | www.legambienteturismo.it |
| **Certifying Organisation** | Legambiente Turismo |
| **Partner Organisation/s** | National, regional and local organisations and tourism authorities |
| **Scope** | Italy |
| **Certified Businesses** | 426 |
| **Sustainability Areas** | Environment, Economy, Cultural Heritage |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | On-site third-party verification every year |

## Nordic Swan

| | |
|---|---|
| The Nordic Swan certifies hotels, youth hostels, restaurants, supermarkets, car washes and laundries. The national partner organisations are official agencies and as such are also responsible for examining and awarding the EU Ecolabel. | |
| **Internet** | www.svanen.se |
| **Certifying Organisation** | SIS Ecolabelling AB |
| **Partner Organisation/s** | - |
| **Scope** | Sweden, Norway, Danemark, Finland, Iceland |
| **Certified Businesses** | 331 |
| **Sustainability Areas** | Environment |
| **Transparency** | Standard published |
| **Verification Procedure** | On-site third-party verification every 3–4 years |

## Sistema de Turismo Responsable (STR)

| | |
|---|---|
| The Biosphere Responsible Tourism label certifies accommodations as well as restaurants, amusement parks, golf courses, attractions, and entire destinations, e. g. biosphere regions and cities. | |
| **Internet** | www.biospherehotels.org |
| **Certifying Organisation** | Instituto de Turismo Responsable |
| **Partner Organisation/s** | Advanced Leisure Services, Fundación Eurochile, Epysa, Desosturcan, TÜV Rheinland, TUI, Instituto de la Hospitalidade, Reserva de Biosfera de la Palma |
| **Scope** | Spain, Dominican Republic, Peru, Chile, Germany, Mexico, United Kingdom, Portugal |
| **Certified Businesses** | 73 |
| **Sustainability Areas** | Environment, Social Issues, Cultural Heritage |
| **Transparency** | Standard partially published |
| **Verification Procedure** | On-site third-party verification every year |

## Ecotourism Australia – ECO Certification Program

The certificate is awarded to accommodations, tourist attractions as well as to trips and tours offered by local tour operators in Australia. It is to be extended in the future to other countries.

| | |
|---|---|
| Internet | www.ecotourism.org.au |
| Certifying Organisation | Eco Tourism Australia |
| Partner Organisation/s | - |
| Scope | Australia |
| Certified Businesses | 548 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification |

## Fair Trade in Tourism South Africa (FTTSA)

FTTSA is the first label initiative under which accommodations, excursions and other tourism products in South Africa are certified on the basis of the internationally accepted Fair Trade criteria. The first fairly traded travel packages to South Africa have been launched under the “Fair Trade Travel” label FTTSA in cooperation with European tour operators.

| | |
|---|---|
| Internet | www.fairtourismsa.org.za |
| Certifying Organisation | Fair Trade in Tourism South Africa |
| Partner Organisation/s | - |
| Scope | South Africa |
| Certified Businesses | 63 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification every 2 years |

## Green Leaf Foundation

The Green Leaf Foundation awards up to five “green leaves” to hotels, spas and holiday resorts. An extension of the standard to the entire tourism industry in Thailand is under preparation.

| | |
|---|---|
| Internet | www.greenleafthai.org/en/green_found |
| Certifying Organisation | Green Leaf Foundation |
| Partner Organisation/s | Tourism Authority of Thailand, Thai Hotels Association, UNEP and other organisations in the field of energy, water and environment |
| Scope | Thailand |
| Certified Businesses | 224 |
| Sustainability Areas | Environment |
| Transparency | Standard partially published |
| Verification Procedure | On-site second-party verification every 2 years |

## Ecotourism Kenya's Eco-rating scheme

The Kenyan certificate is awarded in the categories of bronze, silver and gold to hotels, lodges and camps. Bronze is also awarded to businesses in neighbouring Tanzania. A separate certification standard is applied to local tour operators.

| | |
|---|---|
| Internet | www.ecotourismkenya.org |
| Certifying Organisation | Eco Tourism Kenya |
| Partner Organisation/s | - |
| Scope | Kenya |
| Certified Businesses | 57 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard not published |
| Verification Procedure | On-site second-party verification every 2 years |

## Certification for Sustainable Tourism (CST)


This certificate is awarded at five levels, from entry level to the maximum level of coverage of the sustainability criteria in all areas. Besides hotels, local tour operators and car rentals can also be certified.

| | |
|---|---|
| Internet | www.turismo-sostenible.co.cr |
| Certifying Organisation | Costa Rican Tourism Board |
| Partner Organisation/s | Comisión Nacional de Acreditación, ICT, UCR, Canatur, INBIO, INCAE, MINAET, UICN |
| Scope | Costa Rica |
| Certified Businesses | 139 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party verification |

## Smart Voyager

Besides hotels and eco lodges, Smart Voyager certifies boats and ships offering excursions along the Amazon River or around the Galapagos Islands. Moreover, the Ecuadorian certificate is available to social institutions and initiatives which collaborate with tourism businesses.

| | |
|---|---|
| Internet | www.smartvoyager.org |
| Certifying Organisation | Conservación y Desarrollo |
| Partner Organisation/s | Global Compact, GSTC, Sustainable Tourism Network of the Americas, Sustainable Agriculture Network, American Ecuadorian Chamber, BrandOscope, Ekobai.com |
| Scope | Ecuador, Colombia, Honduras, Chile |
| Certified Businesses | 45 |
| Sustainability Areas | Environment, Social Issues, Economy |
| Transparency | Standard published |
| Verification Procedure | On-site third-party assessment every year |



| Label | | CSR Tourism | Green Globe | The Green Key | EarthCheck | Travelife | European Ecolabel | Blaue Schwalbe | Viabono | Österreichisches Umweltzeichen | Steinbock-Label | Green Tourism Business Scheme | Legambiente Turismo | Nordic Swan | STR | Ecotourism Australia | Green Leaf Foundation | FTTSA | Ecotourism Kenya's Eco-rating | CST | Smart Voyager |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Sustainability areas | Environment | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● | ● |
| | Social Issues | ● | ● | | ● | ● | | ● | | | ● | ● | | | ● | ● | | ● | ● | ● | ● |
| | Economy | ● | ● | | | ● | | ● | ● | | ● | | ● | | | ● | | ● | ● | ● | ● |
| | Cultural Heritage | | ● | | ● | | | | | | | ● | ● | | ● | | | | | | |
| Transparency | Published | ● | ● | ● | | ● | ● | | ● | ● | ● | | ● | ● | | ● | | ● | | ● | ● |
| | Partially published | | | | | | | ● | | | | ● | | | ● | | ● | | | | |
| | Not published | | | | ● | | | | | | | | | | | | | | ● | | |
| Credibility | On-site third-party verification | ● | ● | ● | ● | ● | ● | | | ● | ● | ● | ● | ● | ● | ● | | ● | | ● | ● |
| | On-site second-party verification | | | | | | | | | | | | | | | | ● | | ● | | |
| | First-party desk-top verification | | | | | | | ● | ● | | | | | | | | | | | | |

# 3. ජාතික තිරසර සංචාරක සේවා සහතිකරණය (NSTC) පිළිබඳ හැඳින්වීම

ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණය නිර්මාණය කිරීමේ අරමුණ වුයේ සංචාරක කර්මාන්තයේ තිරසර බව ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ඉහළ ඉල්ලුමක් ඇති ගමනාන්තයක් ලෙස තරඟ කිරීම සඳහා සහය දැක්වීමයි. හෝටල් සහ නවාතැන් පිළිබඳ අවධානය යොමු කරමින් මෙම සහතික කිරීමේ වැඩසටහනේ පළමු අදියර 2018 දී දියත් කරන ලදී. මෙම සහතිකකරණය සඳහා වන නිර්ණායක ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රතීතන ආයතනයක් වන ගෝලීය තිරසර සංචාරක කවුන්සිලයේ (GSTC) මාර්ගෝපදේශ මත පදනම් විය. මෙම වැඩසටහන යටතේ හෝටල් 37ක් ඒවායේ තිරසර භාවිතයන් සඳහා පිළිගැනීමට ලක් වූ අතර ප්ලැටිනම්, රන්, රිදී සහ ලෝකඩ තත්ත්වයන් පිරිනමන ලදී. සහභාගීත්වය සඳහා සහතිකපත් ද ප්‍රදානය කරන ලද අතර තිරසර කළමනාකරණය, සමාජීය, සංස්කෘතික සහ ආර්ථික තිරසරත්වය යන ක්ෂේත්‍ර පදනම් කර ගනිමින් විශේෂ සම්මාන ද පිරිනැමිණි. මෙම සහතිකකරණ වැඩසටහන සංචාරක ක්ෂේත්‍රයේ තිරසර බව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මුලපිරීමකි.



# 4. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණයේ ප්‍රතිලාභ

මීට ඉහත දී අවශ්‍ය සම්පත් සහ තාක්ෂණය සහිත සංවර්ධිත රටවලට පමණක් සීමා වූ තිරසර සංචාරක සහතිකකරණය කෙරෙහි මේ වන විට සංවර්ධනය වෙමින් පවතින රටවල ද දැඩි උනන්දුවක් ඇති වී තිබේ. ජාතික තිරසර සංචරණ සහතිකකරණය (NSTC) ලබා ගැනීමෙන් බොහෝ හෝටල් සහ අනෙකුත් නවාතැන් සපයන්නන්ට බොහෝ ප්‍රතිලාභ සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැක. මෙම ප්‍රතිලාභ සමහරක් පහත සඳහන් වේ:

- ශ්‍රී ලංකාව තිරසර සංචාරක ගමනාන්තයක් ලෙස සන්නාම කිරීම.
- සහතික කිරීම හරහා ගමනාන්තයේ තිරසර ප්‍රමිතීන් ඉහළ නැංවීම. නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ දී NSTC ලේබලය ඇතුළත් කිරීමෙන් අධික පාරිභෝගික ඉල්ලුමක් ආකර්ෂණය කර ගැනීමට හැකියාව ලැබීම.
- ස්වභාවික, සංස්කෘතික පරිසරයට අවම සහ කළමනාකරණය කළ බලපෑම් සිදුවීම සහ මෙම සම්පත් වල අගය දැඩි ලෙස වර්ධනය වීම
- සංරක්ෂණ කටයුතු සඳහා දායක වීමෙන් ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම. එය පරිසර ආරක්ෂණයේ නියාමන පිරිවැය අඩු කරයි.
- ස්වාභාවික සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පිරිවැය අඩුකර කර ගැනීමට හැකියාව ලැබීම සහ ව්‍යාපාර මෙහෙයුම් වැඩිදියුණු කිරීමට හැකිවීම.
- ස්වභාවික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම - සංරක්ෂණය සහ කළමනාකරණය තුළින් ජලය කල්පනාකාරීව භාවිතා කිරීම සහ අපද්‍රව්‍ය අවම කිරීම සහ කළමනාකරණය කිරීම.
- බලශක්ති කාර්යක්ෂමව භාවිතා කිරීම - භාවිතා කරන විදුලිය, ගෑස් සහ ඉන්ධන අඩු කිරීම සහ විකල්ප සහ පුනර්ජනනීය බලශක්ති භාවිතා කිරීම.
- සහතිකකරණය සෞඛ්‍යය, ආරක්ෂාව, පරිසරය සහ සමාජ ස්ථාවරත්වය පිළිබඳ කර්මාන්ත ප්‍රමිතීන් ඉහළ නංවයි.
- දේශගුණික විපර්යාස අවම කිරීම.
- සංචාරක ජීවනෝපායන් මගින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට සහාය වීම සහ ඊට ප්‍රතිචාරයක් ලෙස සංචාරක ව්‍යාපාරය සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන් ලැබෙන සහයෝගය වැඩි වීම.
- කාර්ය මණ්ඩලය, ප්‍රජාවන්, ක්‍රියාකරුවන් සහ සංචාරයකින්ට ස්වභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය වැඩි වීම. තිරසරභාවය හා සම්බන්ධ ගැටළු පිළිබඳ දැනුවත් වීමක් සහ අධ්‍යාපනයක් ලැබෙන අයුරින් පාර්ශවකරුවන් අතර මනා සන්නිවේදනයක් ඇතිවීම.
- තරඟකාරී වාසියේ නව මූලාශ්‍රයක් වීම, වැඩි අලෙවිකරණ හැකියාව/ සන්නාම පක්ෂපාතිත්වය.
- ශ්‍රී ලංකාව කෙරෙහි සංචාරකයින්ගේ විශ්වාසය සහ සබැඳියාව ගොඩනැගීම.
- ජාත්‍යන්තර තිරසර සම්මාන දිනා ගැනීමට සුදුසුකම් ලැබීම.
- සමස්ත කර්මාන්තය සඳහාම පොදු අපක්ෂපාතී ජාතික යෝජනා ක්‍රමයක් තුළින් වාසි ලබා ගැනීමට හැකිවීම සහ අනෙකුත් සහතිකකරණයන් සඳහා වන අපේක්ෂිත පිරිවැය ඉතිරිකර ගැනීමට හැකිවීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ පිළිගැනීම හා සම්බන්ධ වීමට හැකිවීම.
- ප්‍රජාවන්ට ආර්ථික ප්‍රතිලාභ ගලා යාමට සැලසීමේන් සහතිකකරණය තුළින් විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම අඩු කිරීමට උපකාරී වීම.
- ශ්‍රී ලංකාවට අනෙකුත් ගමනාන්ත සමඟ සැසඳීමට ද උපකාර වීම.

# 5. ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණයේ අපේක්ෂිත ප්‍රතිඵල

- ශ්‍රී ලංකාවේ තිරසර සංචාරක ව්‍යාපාර සහතිකකරණය සඳහා SLTDA වෙත හැකියාව ලැබෙන අයුරින් ජාතික තිරසර සංචාරක සේවා සහතිකකරණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම.

- ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය මතකයෙන් ගිලිහී නොයන, සැබෑ සහ නානාවිධ අත්දැකීම් සඳහා ඇති ලොව හොඳම දිවයින ලෙස පිළිගැනීමේ දැක්ම සඳහා ක්‍රියා කරයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම රට ජාතික සහතිකකරණයක් ලබා ගත යුතුය. මෙම සහතිකකරණය ශ්‍රී ලංකාවට එහි ස්වභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබිඹු කරන. සමාජීය වශයෙන් සියල්ල ඇතුළත් සහ පාරිසරික වශයෙන් වගකියන, සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන අසාමාන්‍ය අත්දැකීම් ලබා දීමට උපකාරී වේ.

- ජාතික තිරසර සංචාරක සේවා සහතික කිරීමේ යෝජනා ක්‍රමය (NSTC) සංචාරක ව්‍යාපාර සඳහා පාරිසරික හා සංස්කෘතික වශයෙන් සංවේදී භාවිතයන් සඳහා දිරිගැන්වීම් ලබා දෙනු ඇත. මෙය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඒවා වඩාත් තරඟකාරී බවට පත්වීම සඳහා උපකාර වනු ඇත.

- අනාගත පරපුර සඳහා රටේ සම්පත් සංරක්ෂණය කිරීම උදෙසා පරිසරයට සහ දේශීය සංස්කෘතියට සංචාරක ව්‍යාපාරය තුළින් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ. ඊට අමතරව, එය ආදායම් උත්පාදනය කිරීම, නිපුණතා සහිත රැකියා අවස්ථා ලබා දීම, සහ දේශීය ජනතාව, සංචාරක සමාගම් සහ සංචාරකයින් සඳහා ධනාත්මක සංවර්ධන අත්දැකීමක් නිර්මාණය කිරීම යනාදිය සිදුකරනු ලබයි. මෙමගින් දරිද්‍රතාවය අවම කිරීම සඳහා දායකත්වය  සැපයීම ද ඇතුළුව සංචාරක ව්‍යාපාරයේ ධනාත්මක දායකත්වය උපරිම තත්වයකට ගෙන එයි.

- සංවර්ධනය සඳහා ඉඩ ප්‍රස්ථාව සලසමින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා තිරසර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. තනි සංචාරක ව්‍යාපාරවල තරඟකාරිත්වය වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකාව තිරසර සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ද එය අත්‍යවශ්‍ය වේ. මෙම සහතික කිරීමේ යෝජනා ක්‍රමය සංචාරක ව්‍යාපාරයේ ඍණාත්මක බලපෑම් අවම කිරීමට මෙන්ම වඩාත් පාරිසරික වගකීම් සහිත භාවිතයන් වෙත වෙනස්වීම සඳහා ව්‍යාපාර දිරිගැන්වීමට උපකාරී වනු ඇත.

- එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (UNSDG) කිහිපයකටම පාහේ සංචාරක ව්‍යාපාරය දැඩි සම්බන්ධතාවයකින් යුක්ත වේ. විශේෂයෙන්ම, සංචාරක කර්මාන්තය සමඟ විශේෂයෙන් සමීප සබඳතාවයක් ඇති තිරසර සංවර්ධන ඉලක්ක තුනක් තිබේ. මෙම අරමුණු සඳහා දායක වීම තුළින් තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම ලොව පුරා ජනයාගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා සංචාරක කර්මාන්තයට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකිය.

# 6. ගෝලීය තිරසර සංචාරක කවුන්සිලය

Global Sustainable Tourism Council (GSTC) ගෝලීය තිරසර සංචාරක කවුන්සිලය (GSTC) යනු සංචාරක කර්මාන්තයේ තිරසර බව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ලාභ නොලබන සංවිධානයකි. මෙම ඉලක්කය සපුරා ගනු වස් උපකාර කිරීම සඳහා, GSTC විසින් GSTC නිර්ණායක සකස් කර ඇති අතර, ඒවා නිශ්චිත ගමනාන්තයක නිශ්චිත අවශ්‍යතාවලට ගැලපෙන පරිදි සකස් කළ හැකි තිරසර සංචාරක භාවිතාවන් සඳහා වන මාර්ගෝපදේශ වේ. GSTC නිර්ණායක ප්‍රධාන කාණ්ඩ හතරක් ඔස්සේ සංවිධානය කර තිබේ.

**තිරසර කළමනාකරණය:** පාලනය, සැලසුම්කරණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් ඇතුළුව සංචාරක ගමනාන්තයක කළමනාකරණයට අදාළ ගැටළු මෙම කාණ්ඩය ආවරණය කරයි.

**සමාජ ආර්ථික බලපෑම්:** රැකියා උත්පාදනය, ආදායම් උත්පාදනය සහ ප්‍රතිලාභ බෙදා හැරීම ඇතුළුව දේශීය ආර්ථිකයට සංචාරක ව්‍යාපාරය බලපාන ආකාරය කෙරෙහි මෙම කාණ්ඩය අවධානය යොමු කරයි.

**සංස්කෘතික බලපෑම්:** උරුම ස්ථාන සංරක්ෂණය කිරීම සහ සංස්කෘතික භාවිතයන් ඇතුළුව ගමනාන්තයක සංස්කෘතියට සහ සම්ප්‍රදායන්ට සංචාරක කර්මාන්තය බලපාන ආකාරය මෙකී කාණ්ඩය විසින් ආවරණය කරනු ලබයි.

**පාරිසරික බලපෑම්:** මෙම කාණ්ඩය ස්වභාවික සම්පත් කළමනාකරණය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ හරිතාගාර වායු විමෝචනය සම්බන්ධ ගැටළු ඇතුළුව සංචාරක ව්‍යාපාරයේ පාරිසරික බලපෑම් ආමන්ත්‍රණය කරයි.

GSTC නිර්ණායක සැලසුම් කර ඇත්තේ යම් ගමනාන්තයක නිශ්චිත අවශ්‍යතා සහ කොන්දේසි වලට නම්‍යශීලී වීමට සහ අනුවර්තනය වීමට හැකි වන අයුරින්ය. ඒවා ප්‍රාදේශීය මට්ටමින් තිරසර සංචාරක භාවිතයන් සඳහා වඩාත් සවිස්තරාත්මක මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සඳහා පදනමක් ලෙස සේවා සපයනු ඇති බව බලාපොරොත්තු වේ. GSTC නිර්ණායක සංවර්ධනය කිරීමට අමතරව, GSTC විසින් හෝටල්, සංචාරක මෙහෙයුම්කරුවන් සහ ගමනාන්ත සඳහා තිරසර ප්‍රතිපත්ති සහ භාවිතයන් ඇති බවට සහතික කරන සහතිකකරණ ආයතන සඳහා ප්‍රතීතනය ද සපයයි. මෙම ප්‍රතීතන වැඩසටහන ASI/Assurance Services International සමඟ හවුල්කාරිත්වයෙන් සිදුකරනු ලැබේ.

GSTC යනු ලොව පුරා සේවය කරන කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයන් සිටින අතථ්‍ය සංවිධානයකි. එය පරිත්‍යාග, අනුග්‍රාහකත්වය සහ සාමාජික ගාස්තු හරහා අරමුදල් සපයා ගනු ලබන අතර රජයන්, සංචාරක සමාගම්, හෝටල්, රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලයන් ඇතුළු විවිධ සහ ගෝලීය සාමාජිකත්වය නියෝජනය කරයි. මෙහි නිර්ණායක කට්ටල දෙකක් දක්නට ලැබේ.

- GSTC කර්මාන්ත නිර්ණායක - හෝටල්/නවාතැන් සහ සංචාරක මෙහෙයුම්කරුවන්/ නියෝජිතායතන සඳහා සවිස්තරාත්මක මගපෙන්වීමක් සමඟින්, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සියලු කාණ්ඩවල ව්‍යාපාර සඳහා මාර්ගෝපදේශ මූලධර්ම
- GSTC ගමනාන්ත නිර්ණායක - ප්‍රතිපත්ති සඳහා (ජාතික, පළාත්, ආදිය) සහ ගමනාන්ත කළමනාකරණය සඳහා මාර්ගෝපදේශය
- GSTC නිර්ණායක මඟින් තිරසර සංචාර සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ සවිස්තරාත්මක නිර්වචනයක් සපයන අතර, තිරසරත්වයේ කුළුණු හතරකට සහාය වීම සඳහා එය සකස් වී තිබේ:
  - තිරසරත්වය සඳහා කළමනාකරණය
  - සමාජීය
  - සංස්කෘතිය සහ ප්‍රජාව
  - පරිසරය

  නිර්ණායකවල සමහර භාවිතයන් තුළ පහත සඳහන් දේ ඇතුළත් වේ.

- තිරසරත්වය සඳහා සහතිකකරණයේ දී පදනම ලෙස ක්‍රියාකිරීම
- සෑම පරිමාණයකම ව්‍යාපාර වඩාත් තිරසර වීමට මූලික මාර්ගෝපදේශ ලෙස ක්‍රියාකිරීම සහ මෙම ගෝලීය නිර්ණායක සපුරාලන තිරසර සංචාරක වැඩසටහන් තෝරා ගැනීම සඳහා ව්‍යාපාරවලට සහාය වීම.
- සංචාරකයින් සහ සංචාරක ආයතන සඳහා සැපයුම්කරුවන් සහ තිරසර සංචාරක වැඩසටහන් තෝරා ගැනීමේදී මග පෙන්වීමක් ලෙස සේවය කරමින් තිරසර නිෂ්පාදන සඳහා වර්ධනය වන වෙළඳපල තුළ වැඩි වෙළඳපල ප්‍රවේශයක් ලබා දීම.
- යහපත් තිරසර සංචාරක වැඩසටහන් සහ ව්‍යාපාර හඳුනා ගැනීමට පාරිභෝගිකයින්ට උපකාර කිරීම.
- තිරසර සංචාරක සැපයුම්කරුවන් හඳුනා ගැනීම සඳහා තොරතුරු මාධ්‍ය සඳහා පොදු සාධකයක් ලෙස ක්‍රියාකිරීම.
- සහතිකකරණ සහ අනෙකුත් ස්වේච්ඡා වැඩසටහන් ඒවායේ ප්‍රමිතීන් පුළුල් ලෙස පිළිගත් මූලික පදනමක් මත සපුරාලීම තහවුරු කිරීම සඳහා සහාය වීම.
- තිරසර සංචාරක අවශ්‍යතා සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ වැඩසටහන් වෙත ආරම්භක ලක්ෂ්‍යයක් ලබා දීම.
- හෝටල් පාසල් සහ විශ්වවිද්‍යාල වැනි අධ්‍යාපන සහ පුහුණු ආයතන සඳහා මූලික මාර්ගෝපදේශ ලෙස ක්‍රියාකිරීම.
- ක්‍රියා කිරීමට අන් අයව පොළඹවන නායකත්වය ප්‍රදර්ශනය කිරීම.

# 7. තිරසර සංචාරක සේවා සහතිකකරණය සඳහා අයදුම් කිරීම

## 7.1. සහතිකකරණය සඳහා අයදුම් කළ හැක්කේ කාටද?

ශ්‍රී ලංකාවේ සියලුම ලියාපදිංචි හෝටල් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හරහා සහතිකකරණය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

## 7.2. සහතික කරවා ගන්නේ කෙසේද?

### 7.2.1. සහතිකකරණ සඳහා අයදුම් කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් සංචාරක කර්මාන්තයේ නියැළි සිටින හෝටල් සහ අනෙකුත් නවාතැන් සපයන්නන් සඳහා සහතිකකරණය විවෘත වන අවස්ථාව නිවේදනය කරනු ලැබේ. සහතිකකරණය ලබා ගැනීමට කැමැත්තක් දක්වන පාර්ශවයන්, SLTDA විසින් සපයනු ලබන මූලික අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අයදුම් කළ හැක.

### 7.2.2. අයදුම්පත්/ලේඛන ගත සාක්ෂි SLTDA වෙත ඉදිරිපත් කිරීම

මූලික අයදුම්පත්‍රය ලැබීමෙන් පසු, NSTC ප්‍රමිතීන්ට කෙතරම් දුරට අනුකූල වන්නේ දැයි සොයා බැලීම සඳහා SLTDA තොරතුරු සහ විවිධ ව්‍යාපාරික ලේඛන ඉල්ලා සිටී. SLTDA විසින් නියම කර ඇති කාල සීමාව තුළ අදාළ සියලුම ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

### 7.2.3. සමාලෝචන (ඩෙස්ක්ටොප්) තක්සේරුව සහ අදහස් විමසීම

SLTDA විසින් සහතික කිරීමේ ක්‍රියාවලියේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද සියලුම ලියකියවිලි සමාලෝචනය කරනු ඇත. ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් හෝ කරුණක් පැහැදිලි කිරීමට අවශ්‍ය වන්නේ නම් ඔවුනට අයදුම්කරුට සෘජුව සම්බන්ධ විය හැක.

### 7.2.4. ස්ථානීය විගණනය

සංචාරක සංවර්ධන අධිකාරිය අයදුම් කල හෝටල් එහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආකාරය සොයා බැලීම සඳහා ස්ථානීය පරීක්ෂණයන් කරනු ලැබේ. මෙම සංචාරයේදී SLTDA හි විගණන කණ්ඩායම නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින් තිරසරභාවය පිළිබඳ සඳහන් වූ කරුණු සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරු කරනු ඇත. සහතිකකරණය ක්‍රියාවලියට පහසු වන අයුරින් ඕනෑම උපකාරක තොරතුරක් අයදුම්කරු විසින් සැපයිය හැකිය.

### 7.2.5. විගණන වාර්තා

ස්ථානීය විගණනයෙන් පසු හෝටලය පිළිබඳ වාර්තාවක් ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර ශ්‍රේණිගත කිරීමක් ලබා දෙනු ඇත.

### 7.2.6. සහතිකය නිකුත් කිරීම

හෝටලය NSTC ප්‍රමිතියට අනුකූල බව SLTDA විසින් තහවුරු කළ පසු සහතිකය නිකුත් කරනු ලැබේ. SLTDA විසින් විධිමත් සහතිකයක් නිකුත් කරනු ලැබේ.

### 7.2.7. සහතිකය අලුත් කිරීම

සහතිකකරණය අලුත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුත්තේ කුමන කාලයේ ද යන වග හෝටල් සංචාරක අධිකාරිය වෙතින් විමසා කරුණු දැන ගත යුතුය. සාමාන්‍යයෙන්, සහතිකය වසර දෙකක කාලයක් සඳහා වලංගු වේ.

# 8. සංචාරක සේවා සහතිකකරණ ක්‍රියාවලිය

පහත ප්‍රවාහ සටහන සහතිකකරණ ක්‍රියාවලිය පිළිබඳ සාමාන්‍ය දළ විශ්ලේෂණයක් සපයයි.

**සංචාරක පාර්ශවකරුවන් සඳහා පාර්ශවකරුවන්ගේ උපදේශන/ වැඩමුළුව**

↓

**සංචාරක අධිකාරිය මගින් අයදුම්පත් කැඳවීම**

↓

**අයදුම්පත ඉදිරිපත් කිරීම**

↓

**අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීම**

↓

**සමාලෝචන තක්සේරුව**

↓

**ස්ථානීය විගණනය**

↓

**විගණන වාර්තාව ඉදිරිපත් කිරීම**

↓

**විගණන වාර්තාව ඇගයීම සහ ශ්‍රේණිගත කිරීම**

↓

**සහතිකය පිරිනැමීම**

# 9. සහතිකකරණය සඳහා සූදානම් වන්නේ කෙසේද?

සහතිකකරණය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසු, තිරසර භාවිතයන් පිළිබඳ ඔවුන්ගේ හිමිකම් කිම සනාථ කිරීම සඳහා ලියකියවිලි, ඡායාරූප සහ වෙනත් සාක්ෂි සැපයීමට අයදුම්කරු සූදානම් විය යුතුය. මෙලෙස සපයනු ලබන ද්‍රව්‍ය සමාලෝචන (ඩෙස්ක්ටොප්) තක්සේරුවකදී ප්‍රවේශමෙන් ඇගයීමට ලක් කෙරෙන අතර ස්ථානීය විගණනයකදීද පරීක්ෂාවට ලක් විය හැක. ස්ථානීය විගණනය පිළිබඳව අයදුම්කරුට දැනුම් දෙනු ලබන අතර අවශ්‍ය ලියකියවිලි සහ ඉදිරිපත් කිරීම් සකස් කර අදාළ කාර්ය මණ්ඩලය කල්තියා යෙදිය යුතුය.

සහතිකකරණය සඳහා වන ස්වයං පිරික්සුම් ලැයිස්තුව යනු සහතික කිරීම සඳහා හෝටල් විසින් සපුරාලිය යුතු නිර්ණායක අඩංගු ලැයිස්තුවකි. එය අයදුම්කරුවන්ට ඔවුන්ගේ වර්තමාන තිරසර ප්‍රමිතීන් තක්සේරු කිරීමට සහ පිරික්සුම් ලැයිස්තුවේ සියලුම අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කිරීමට අවශ්‍ය යම් ක්ෂේත්‍රයක් වන්නේ ද ඒම ක්ෂේත්‍ර ද හඳුනා ගැනීමට මාර්ගෝපදේශයක් ලෙසද ක්‍රියා කරයි.

නවාතැන් අංශය සඳහා වන පිරික්සුම් ලැයිස්තුව පුළුල් ලෙස පහත ක්ෂේත්‍ර ආවරණය කරයි.

- ඵලදායී තිරසර කළමනාකරණයක් නිරූපණය කිරීම
- ප්‍රාදේශීය ප්‍රජාවට සමාජ හා ආර්ථික ප්‍රතිලාභ හැකි තරම් උපරිම කිරීම සහ අහිතකර බලපෑම් අවම කිරීම
- සංස්කෘතික උරුමයන් කෙරෙහි ප්‍රතිලාභ උපරිම කිරීම සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම
- පරිසරයට ලැබෙන ප්‍රතිලාභ උපරිම කිරීම සහ අහිතකර බලපෑම් අවම කිරීම
- ජෛව විවිධත්වය, පරිසර පද්ධති සහ භූ දර්ශන සංරක්ෂණය

ජාතික තිරසර සංචාරක සේවා සහතිකය (NSTC) සඳහා අයදුම් කරන හෝටල්, තක්සේරු කරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විගණන ක්‍රියාවලිය සඳහා සම්පූර්ණයෙන්ම සූදානම් බව සහතික කළ යුතුය. විගණනයේ දී සාර්ථකව සමත් වීම සඳහා ස්වයං පිරික්සුම් ලැයිස්තුව හොඳින් සමාලෝචනය කිරීම සහ කිසියම් අඩුපාඩුවක් පවතින්නේ නම් එය නිවරැදි කිරීම සඳහා කටයුතු කිරීම වැදගත් වේ.

# 10. ලේඛන ගත සහ අනෙකුත් සාක්ෂි සැකසීම/ඉදිරිපත් කිරීම සඳහා ස්වයං-පරීක්ෂණ ලැයිස්තුව

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **අංශය අඃ ඵලදායී තිරසර කළමනාකරණයක් නිරූපණය කිරීම** | | |
| **අ 1 තිරසර කළමනාකරණ පද්ධතිය**<br>සංවිධානය එහි ප්‍රමාණයට සහ විෂය පථයට ගැලපෙන පාරිසරික, සමාජීය, සංස්කෘතික, ආර්ථික, ගුණාත්මකභාවය, මානව හිමිකම්, සෞඛ්‍ය, ආරක්ෂාව, අවදානම් සහ අර්බුද කළමනාකරණ ගැටළු ආමන්ත්‍රණය කරන දිගු කාලීන තිරසර කළමනාකරණ පද්ධතියක් ක්‍රියාවට නංවා ඇති අතර එහි අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පරිශ්‍රමයක් යොදයි. | අ. තිරසර කළමනාකරණ (SM) පද්ධතිය පැහැදිලිව ලේඛනගත කර ඇත.<br>ආ. SM පද්ධතිය පාරිසරික, සමාජීය, සංස්කෘතික, ආර්ථික, ගුණාත්මක, මානව හිමිකම්, සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටළු ආවරණය කරයි.<br>ඇ. SM පද්ධතිය තුළ අවදානම් සහ අර්බුද කළමනාකරණය පිළිබඳ සලකා බැලීම ඇතුළත් වේ.<br>ඈ SM පද්ධතිය ක්‍රියාත්මක කිරීම සිදුකරන්නේ ද යන වග ලේඛනගත සාක්ෂි පෙන්නුම් කරයි.<br>ඉ. SM පද්ධතිය තුළ තිරසර කාර්ය සාධනයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ඇතුළත් වේ. | |
| **ආ 2 නීතිමය අනුකූලතාවය**<br>සංවිධානය සෞඛ්‍ය, ආරක්ෂාව, කම්කරු හා පාරිසරික අංශ ඇතුළු අදාළ සියලුම දේශීය, ජාතික සහ ජාත්‍යන්තර නීති සහ රෙගුලාසිවලට අනුකූල වේ. | අ. අදාළ වන සියලුම නීතිමය අවශ්‍යතා පිළිබඳ යාවත්කාලීන ලැයිස්තුවක් පවත්වාගෙන යනු ලැබේ.<br>ආ. සහතික හෝ වෙනත් ලේඛනමය සාක්ෂි මගින් අදාළ සියලු නීතිමය අවශ්‍යතාවලට සංවිධානය අනුකූල බව පෙන්වයි. | |
| **අ 3 වාර්තා කිරීම සහ සන්නිවේදනය**<br>සංවිධානය සිය තිරසර ප්‍රතිපත්ති, ක්‍රියා සහ කාර්ය සාධනය පාරිභෝගිකයන් ඇතුළු පාර්ශ්වකරුවන්ට සන්නිවේදනය කරන අතර ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට උත්සාහ කරයි. | අ. තිරසර කාර්ය සාධනය පිළිබඳ නිතිපතා වාර්තා ලබා දෙනු ලැබේ.<br>ආ. තිරසර ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිබඳ බාහිර හා අභ්‍යන්තර සන්නිවේදන ද්‍රව්‍යවල වාර්තා වේ.<br>ඇ. සන්නිවේදනය තුළ පාරිභෝගික සහ පාර්ශවකරුවන්ගේ සහාය සඳහා ආරාධනා කරන පණිවිඩ අඩංගු වේ. | |
| **අ 4 කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය**<br>කාර්ය මණ්ඩලය තිරසර කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහි නිරතව සිටින අතර එය ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන්ගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව වරින් වර මග පෙන්වීම සහ පුහුණුව ලබා ගනී. | අ. SM පද්ධතිය සමඟ කාර්ය මණ්ඩලය සම්බන්ධ වී ඇති බවට සාක්ෂි තිබේ.<br>ආ. පැමිණීම, පාඨමාලා සහ කාර්යයෙහි නිරතවීමෙන් ලැබෙන පුහුණුව යනාදිය පිළිබඳ වාර්තා තිබේ.<br>ඇ. කාර්ය මණ්ඩල පුහුණු සහ මාර්ගෝපදේශ ද්‍රව්‍ය ප්‍රවේශ විය හැකි ආකෘතියෙන් ලබා ගත හැකිය (අවශ්‍ය විට සුළුතර භාෂා භාවිතය ඇතුළුව).<br>ඈ. කාර්ය මණ්ඩලය අදාළ විෂයයන්/නිපුණතා පිළිබඳ සහතික සහ සුදුසුකම් දරයි. | |
| **අ 5 පාරිභෝගික අත්දැකීම**<br>තිරසරත්වයේ අංශ ඇතුළුව පාරිභෝගික තෘප්තිය අධීක්ෂණය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේග | අ. ප්‍රතිඵල විශ්ලේෂණය සමඟ පාරිභෝගික ප්‍රතිපෝෂණ ලබා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.<br>ආ. මේ සඳහා ලැබුණු ඍණාත්මක ප්‍රතිපෝෂණ සහ ප්‍රතිචාර සටහන් කර ඇත.<br>ඇ. නිවැරදි කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත් බවට සාක්ෂි තිබේ. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **අ 6 නිරවද්‍ය ප්‍රවර්ධනය**<br><br>තිරසරභාවය හා සම්බන්ධ හිමිකම් පෑම ඇතුළුව සංවිධානය සහ එහි නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධයෙන් ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ අලෙවිකරණ සන්නිවේදනයන් නිරවද්‍ය මෙන්ම පාරදෘශ්‍ය වේ. ඔවුන් කිසිවිටකත් ලබා දෙනවාට වඩා වැඩි යමක් පොරොන්දු වන්නේ නැත. | අ. ප්‍රවර්ධනයේදී භාවිතා කරනු ලබන රූප සපයනු ලබන සැබෑ අත්දැකීම් සහ පහසුකම් පමණක් ප්‍රදර්ශනය කරයි.<br><br>ආ. තිරසරභාවය පිලිබඳ හිමිකම් පෑම පසුගිය කාර්ය සාධන වාර්තා මත පදනම් වේ. | |
| **අ 7 ගොඩනැගිලි සහ යටිතල පහසුකම්**<br><br>ගොඩනැගිලි සැලසුම් කිරීම, ස්ථානගත කිරීම, සැලසුම් කිරීම, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය, ක්‍රියාත්මක කිරීම සහ කඩා ඉවත් කිරීම සහ යටිතල පහසුකම්ත්ව | ඇ. A7 නිර්ණායක සඳහා වන දර්ශක සහතික කර ඇති නවාතැන් හා එයට අදාල ගොඩනැගිලි සහ යටිතල පහසුකම් හා සම්බන්ධ වේ. | |
| **අ 7.1 අනුකූලතාව**<br><br>ආරක්ෂිත සහ සංවේදී ප්‍රදේශ මෙන්ම උරුමය හා සම්බන්ධ සලකා බැලීම්වලට අදාළ කලාපීය අවශ්‍යතා සහ නීතිවලට අනුකූල වීම. | අ. ඉඩම් පරිහරණය සහ ක්‍රියාකාරකම් පිලිබඳ ප්‍රාදේශීය වශයෙන් ඇති නීති පිළිබඳ දැනුවත් වී සිටීම සහ ඒවාට අනුකූල වීම ප්‍රදර්ශනය කෙරේ.<br><br>ආ. අවශ්‍ය සියලුම බලපත්‍ර සහ අවසර පත්‍ර යාවත්කාලීන කර තිබේ.<br><br>ඉ. ව්‍යවස්ථාපිත නොවන ප්‍රදේශ කළමනාකරණ සැලසුම් සහ මාර්ගෝපදේශ (උදා: විශේෂිත කලාප සඳහා, සැලසුම්, ආදිය) පිළිබඳ දැනුවත්භාවය සහ ඒවාට අනුකූල වීම ප්‍රදර්ශනය කෙරේ. | |
| **අ 7.2 බලපෑම සහ අඛණ්ඩතාව**<br><br>ස්වාභාවික හා සංස්කෘතික වටපිටාවේ ධාරිතාව සහ අඛණ්ඩතාව සැලකිල්ලට ගැනීම. | අ. ස්ථානය තෝරාගැනීම, සැලැසුම් කිරීම සහ ප්‍රවේශය යනාදියේ දී දෘශ්‍ය පහසුකම්, භූ දර්ශනය, සංස්කෘතික සහ ස්වභාවික උරුමයන් සැලකිල්ලට භාජනය කොට ඇත.<br><br>ආ. ස්ථාන තේරීම, සැලසුම් කිරීම සහ ප්‍රවේශය යනාදීයේ දී ජීව විද්‍යාත්මකව සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ පරිසර පද්ධතිවල සංශ්ලේෂක හැකියාව සැලකිල්ලට ගෙන ඇත.<br><br>ඇ. පුරාවිද්‍යාත්මක, සංස්කෘතික උරුමයන් සහ පූජනීය ස්ථානවල අඛණ්ඩතාව ආරක්ෂා වී ඇත.<br><br>ඈ ස්වභාවික ස්ථාන සහ ආරක්ෂිත ප්‍රදේශ වල අඛණ්ඩතාව සහ සම්බන්ධතාවය සංරක්ෂණය කර ඇත.<br><br>ඉ. තර්ජනයට ලක් වූ හෝ ආරක්ෂිත විශේෂයන් වෙනත් ස්ථානවලට ගෙන ගොස් නොමැති අතර සියලුම වනජීවී වාසස්ථානවලට වන බලපෑම අවම කිරීමට කටයුතු කර ඇත.<br><br>ඊ. ජල මාර්ග / ජල පෝෂක / තෙත්බිම් වෙනස් කිරීමකට ලක් නොකර ඇති හැකි සෑම තැනකම ගලා යාම අඩු කර ඇති අතර සෑම අවශේෂ ද්‍රව්‍යක්ම රඳවා ගැනීම හෝ ජල බස්නාවකට සම්බන්ධ කිරීම හෝ පෙරීම සිදු කෙරේ.<br><br>උ. අවදානම් සාධක (දේශගුණික විපර්යාස, ස්වභාවික සංසිද්ධි සහ අමුත්තන්ගේ ආරක්ෂාව ඇතුළුව) තක්සේරු කර ආමන්ත්‍රණය කර ඇත.<br><br>ඌ. බලපෑම් තක්සේරුව (සමුච්චිත බලපෑම් ඇතුළුව) සිදු කර සුදුසු පරිදි ලේඛනගත කර ඇත. | ' |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **අ 7.3 තිරසර භාවිතයන් සහ ද්‍රව්‍ය**<br><br>දේශීය වශයෙන් සුදුසු සහ තිරසර භාවිතයන් සහ ද්‍රව්‍ය යොදා ගැනීම | අ. ගොඩනැගිලි සහ සැලසුම් සඳහා ප්‍රායෝගික සහ සුදුසු තැන්වල දී දේශීය ද්‍රව්‍ය, භාවිතයන් සහ ශිල්ප ක්‍රම භාවිතා කර ඇත.<br><br>ආ. විදේශීය හා ආක්‍රමණශීලී විශේෂවලින් වැළකී තිරසර මූලාශ්‍රවලින් ලබාගත් දේශීය සහ ආවේණික ශාක, භූමි අලංකරණයේදී සහ අලංකරණයේදී භාවිත කර ඇත.<br><br>ඇ. පවතින හෝ අපේක්ෂිත තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව සඳහා පැල තෝරාගෙන ඇත උදා: නියඟයට ඔරොත්තු දෙන ශාක<br><br>ඈ. තිරසර සැලසුම්, ද්‍රව්‍ය සහ ඉදිකිරීම් භාවිතයන් ගොඩනැගිලි සැකසීමේ දී භාවිතා කර ඇති අතර, හැකි සෑම විටම සුදුසු සහතිකකරණයක් ඇත.<br><br>ඉ. ඉදිකිරීම් වලදී අපද්‍රව්‍ය වර්ගීකරණය කර පරිසරයට හිතකර ලෙස බැහැර කරනු ලබයි. | |
| **අ 7.4 සැමට ප්‍රවේශය**<br><br>සුදුසු අවස්ථාවලදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය සහ තොරතුරු ලබා දීමග | අ. මෙහෙයුම් ස්වභාවයට ගැලපෙන පරිදි, ශාරීරික ආබාධ සහ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ස්ථාන, ගොඩනැගිලි සහ ක්‍රියාකාරකම් සඳහා ප්‍රවේශ විය හැකිය.<br><br>ආ. ප්‍රවේශ වීමේ මට්ටම පිළිබඳ පැහැදිලි සහ නිවැරදි තොරතුරු සපයනු ලැබේ.<br><br>ඇ. ප්‍රවේශවීමට ඇති හැකියාව අදාල විශේෂඥයින්/භාවිතා කරනු ලබන ආයතන සමඟ සහතික කර හෝ පරීක්ෂා කර ඇත. | |
| **අ 8 ඉඩම්, ජලය සහ දේපල අයිතිවාසිකම්**<br><br>සංවිධානය විසින් ඉඩම්, ජලය සඳහා යන අයිතිය සහ දේපළ අත්පත් කර ගැනීම නීත්‍යානුකූල වන අතර, ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහ ස්වදේශීය ජනයාගේ නිදහස්, පූර්ව සහ දැනුවත් අවසරය ඇතුළුව ඔවුන්ගේ අයිතිවාසිකම්වලට අනුකූල වන බැවින් ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීම අවශ්‍ය නොවේ. | අ. ඉඩම් අයිතිය සහ බුක්තිය පිළිබඳ අයිතිය ලේඛනගත කර ඇත.<br><br>ආ. ඉඩම් සහ ජලය ඇතුළු ප්‍රධාන සම්පත් සඳහා භාවිතා කිරීමේ සහ ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් සුදුසු පරිදි ලේඛනගත කර ඇත.<br><br>ඇ. ප්‍රාදේශීය සහ ස්වදේශීය ප්‍රජාවන් සමඟ සන්නිවේදනය, සාකච්ඡා කිරීම සහ සම්බන්ධවීම පිළිබඳ ලේඛනගත සාක්ෂි තිබේ.<br><br>ඈ. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ නිදහස්, පූර්ව සහ දැනුවත් කැමැත්ත පිළිබඳ සාක්ෂි අදාළ වන අවස්ථාවන්හි දී ලේඛනගත කර ඇත (සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමක් හෝ ඉඩම් අත්පත් කර ගැනීමක් දක්නට නොලැබේ). | |
| **අ 9 තොරතුරු සහ අර්ථ නිරූපණය**<br><br>සංවිධානය විසින් ස්වභාවික වටපිටාව, දේශීය සංස්කෘතිය සහ සංස්කෘතික උරුමයන් පිළිබඳ තොරතුරු සහ අර්ථ නිරූපණය මෙන්ම ස්වභාවික ප්‍රදේශ, සජීවී සංස්කෘතීන් සහ සංස්කෘතික උරුම ස්ථාන නැරඹීමේදී පිළිපැදීමට සුදුසු හැසිරීම් පිළිබඳ පැහැදිලි කිරීමක් සපයනු ලබයි. | අ. ප්‍රදේශයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ තොරතුරු/අර්ථනිරූපණ ද්‍රව්‍ය ලබා ගත හැකි අතර පාරිභෝගිකයින්ට ඒවා සපයනු ලැබේ.<br><br>ආ. ප්‍රදේශයේ ස්වභාවික හා සංස්කෘතික උරුමයන් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කර පුහුණු කරනු ලැබේ.<br><br>ඇ. ප්‍රදේශයේ පිළිපැදීමට සුදුසු හැසිරීම් පිළිබඳව පාරිභෝගිකයින්ට තොරතුරු සපයනු ලැබේ. | |
| **අ 10 ගමනාන්තයට සම්බන්ධ වී කටයුතු කිරීම**<br><br>ගමනාන්තයේ දී තිරසර සංචාරක සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා අවස්ථාවක් පවතින තත්වයන්හි දී සංවිධානය ඒ හා සම්බන්ධ වේ. | අ. දේශීය ගමනාන්ත කළමනාකරණ සංවිධානය හෝ ඊට සමාන ආයතනයක් තිබෙන්නේ නම් එකී සංවිධානයේ හෝ ආයතනයේ සාමාජිකයෙකු ලෙස සංවිධානය කටයුතු කරයි.<br><br>ආ. ප්‍රාදේශීය ප්‍රජාවන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රාදේශීය ආයතන අතර හවුල්කාරිත්වයක් පවතින්නේ නම් සංවිධානය ද එයට සහභාගී වේ.<br><br>ඇ. ගමනාන්තයේ තිරසර සංචාරක ව්‍යාපාරය සම්බන්ධ සැලසුම් සහ කළමනාකරණ රැස්වීම් සහ ක්‍රියාකාරකම් සඳහා සංවිධානය සහභාගී වේ. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
| --- | --- | --- |
| **ආ කොටස : ප්‍රාදේශීය ප්‍රජාවට සමාජ හා ආර්ථික ප්‍රතිලාභ උපරිම කිරීම සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම** | | |
| **ආ 1 ප්‍රජා සහාය**<br><br>සංවිධානය දේශීය යටිතල පහසුකම් සහ සමාජ ප්‍රජා සංවර්ධනය සඳහා වන මුලපිරීම් සඳහා ක්‍රියාකාරීව සහාය දක්වයි. අධ්‍යාපනය, පුහුණුව, සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව සහ දේශගුණික විපර්යාසවල බලපෑම් ආමන්ත්‍රණය කරන ව්‍යාපෘති යනාදිය මුලපිරීම් සඳහා වන උදාහරණ ලෙස දැක්විය හැකිය. | අ. සහය සඳහා ඇති අවශ්‍යතා සහ අවස්ථා හඳුනාගැනීටමත් ඒවායින් ලැබිය හැකි ප්‍රතිලාභ/සිදුවිය හැකි බලපෑම ඇගයීමටත් සංවිධානය ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සම්බන්ධ වේ.<br><br>ආ. ප්‍රාදේශීය ප්‍රජාව තුළ යෝජනා ක්‍රම සඳහා කරන ලද දායකත්වයේ මට්ටම සහ ස්වභාවය සටහන් කර ගනු ලැබේ.<br><br>ඇ. සපයනු ලබන සංචාරක පහසුකම් සහ සේවාවන් වෙත ප්‍රවේශ වීමට දේශීය ප්‍රජාවට අවස්ථාව ලැබේ. | |
| **ආ 2 දේශීය රැකියා**<br><br>කළමනාකරණ තනතුරු ඇතුළුව රැකියා සහ අභිවෘද්ධිය සඳහා ප්‍රදේශවාසීන්ට සමාන අවස්ථා ලැබේ. | අ. ප්‍රාදේශීය ප්‍රජාව තුළ දැනටමත් පදිංචිව සිටින පුද්ගලයන්ගේ මුළු රැකියා අනුපාතය ගණනය කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කෙරේ.<br><br>ආ. ප්‍රාදේශීය ප්‍රජාවේ දැනටමත් පදිංචිව සිටින පුද්ගලයින්ගෙන් කළමනාකරණ තනතුරුවල නිරත වී සිටින අයවළුන්ගේ රැකියා අනුපාතය ගණනය කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කෙරේ.<br><br>ඇ. ප්‍රදේශවාසීන්ට ඔවුන්ගේ රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා දේ. | |
| **ආ 3 ප්‍රාදේශීය මිලදී ගැනීම්**<br><br>භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී සහ පිරිනැමීමේදී, ප්‍රාදේශීය වශයෙන් ඒවා ලබාගත හැකි නම් සහ ප්‍රමාණවත් ලෙස ඒවා ගුණාත්මක භාවයෙන් යුක්ත වන්නේ නම් සෑම විටම දේශීය සහ සාධාරණ වෙළඳ සැපයුම්කරුවන්ට සංවිධානය ප්‍රමුඛත්වය ලබා දෙයි. | අ. සංවිධානය එහි භාණ්ඩ හා සේවා සැපයුම් මූලාශ්‍ර නිරන්තරයෙන් විගණනය කරයි.<br><br>ආ. ප්‍රදේශීයව හිමි සහ ක්‍රියාත්මක වන ව්‍යාපාරවලින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල අනුපාතය ගණනය කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කෙරේ.<br><br>ඇ. සාධාරණ වෙළඳාමක් සිදුකරන හා ප්‍රාදේශීය නොවන හෝ ප්‍රාදේශීයව ක්‍රියාත්ම නොවන සැපයුම්කරුවන්ගේ අනුපාතය ගණනය කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කෙරේ. | |
| **ආ 4 දේශීය ව්‍යවසායකයින්**<br><br>ප්‍රදේශයේ ස්වභාවය, ඉතිහාසය සහ සංස්කෘතිය මත පදනම් වූ තිරසර නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීම සහ විකිණීම සඳහා සංවිධානය දේශීය ව්‍යවසායකයින්ට සහාය දක්වයි. | අ. ප්‍රාදේශීය ව්‍යාපාරවලට වාණිජ ක්‍රියාකාරකම් සඳහා පරිශ්‍ර සහ පාරිභෝගිකයින්ට ප්‍රවේශ වීමට අවකාශ ලබා දී ඇත.<br><br>ආ. සුදුසු අවස්ථාවලදී, සංවිධානය තමන් සම්බන්ධ වන දේශීය සේවා සපයන්නන්ට ඔවුන්ගේ සේවාවේ ගුණාත්මකභාවය සහ තිරසරභාවය පිළිබඳ උපදෙස් සහ සහාය ලබා දෙයි.<br><br>ඉ. දේශීය ව්‍යවසායකයින් සමඟ හවුල් ව්‍යාපාර සහ හවුල්කාරිත්වය සඳහා ඇති අවස්ථා සලකා බලා සුදුසු අවස්ථාවලදී සම්බන්ධ වේ. | |
| **ආ 5 සූරාකෑම සහ හිරිහැර කිරීම**<br><br>සංවිධානය වාණිජ, ලිංගික හෝ වෙනත් ඕනෑම ආකාරයක සූරාකෑමකට හෝ හිරිහැරයකට එරෙහිව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇති අතර මෙහිදී විශේෂයෙන් ළමයින්, නව යොවුන් වියේ පසුවන්නන්, කාන්තාවන්, සුළු ජාතීන් සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් විශේෂිත වේ. | අ. අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සූරාකෑමට සහ හිරිහැර කිරීමට ලක්වීමට එරෙහිව සංවිධානයට ලේඛනගත ප්‍රතිපත්තියක් ඇත.<br><br>ආ. ප්‍රතිපත්තිය සන්නිවේදනය කර ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කරනු ලබයි.<br><br>ඇ. සංවිධානය සූරාකෑමට හා හිරිහැරයට එරෙහිව කටයුතු කිරීමේ දී ප්‍රාදේශීය ප්‍රජාව සමඟ කටයුතු කරයි.<br><br>ඈ සේවකයින්ගේ වයස පිළිබඳ වාර්තා පවත්වා ගෙන යනු ලබන අතර කිසිදු ආකාරයක ළමා ශ්‍රමිකයෙකු නොමැති බව පෙන්නුම් කරයි (ෂබධ විසින් අර්ථ දක්වා ඇති අයුරින්).<br><br>ඉ. ළමා ලිංගික සංචාරක ව්‍යාපාරයට එරෙහි ක්‍රියාමාර්ග සඳහා සංවිධානය සහාය දක්වයි. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ආ 6 සමාන අවස්ථා**<br><br>සංවිධානය ලිංගභේදය, ජාතිය, ආගම, ආබාධිත හෝ වෙනත් ආකාරවලින් වෙනස් කොට සැලකීමෙන් තොරව කළමනාකරණ තනතුරු ඇතුළු රැකියා අවස්ථා ලබා දෙයි. | අ. කාන්තාවන් සහ ප්‍රාදේශීය සුළුතර ජනයා ඇතුළුව වෙනස්කොට සැලකීමේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් හඳුනාගෙන ඇත.<br><br>ආ. මෙම එක් එක් කන්ඩායම් වලින් ලබා ගන්නා සේවකයින්ගේ අනුපාතය නිරීක්ෂණය කරනු ලබන අතර එය ප්‍රාදේශීය ජනවිකාස වලට අනුරූප වේ.<br><br>ඇ. අභ්‍යන්තර ප්‍රවර්ධනයට මෙම කණ්ඩායම්වල සාමාජිකයන් ඇතුළත් වේ. | |
| **ආ 7 ශිෂ්ඨ රැකියා**<br><br>කම්කරු අයිතිවාසිකම්වලට ගරු කිරීම, ආරක්ෂිත හා සුරක්ෂිත සේවා පරිසරයක් ගොඩනැගීම සේවකයින්ට අවම වශයෙන් ජීවත් වීමට සරිලන වැටුපක් ගෙවීම යනාදිය සිදුවේ. සේවකයින්ට නිතිපතා පුහුණුව, පළපුරුද්ද සහ ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා අවස්ථා ලබා දෙනු ලැබේ. | අ. සංවිධානය ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සහ රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය සහ ඒවාට අනුකූල වීම පෙන්නුම් කරයි.<br><br>ආ. ජීවත් වීමට සරිලන වැටුපක් සඳහා වන ජාතික සම්මතයන්ට අනුකූලව වන අයුරින් වැටුප් මට්ටම් නිරීක්ෂණය කර නිතිපතා සමාලෝචනය කෙරේ.<br><br>ඇ. සියලුම කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වාර්තා පවත්වා ගෙන යනු ලබන අතර, ලැබුණු පුහුණුවේ මට්ටම සහ වාර ගණන එයින් ප්‍රදර්ශනය වේ.<br><br>ඈ සේවක කොන්ත්‍රාත්තු සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය සඳහා සහාය දක්වයි.<br><br>ඉ. සියලුම ස්ථානගත සේවකයින් සඳහා ජලය, සනීපාරක්ෂාක සහ සෞඛ්‍යාරක්ෂක පහසුකම් සපයනු ලැබේ.<br><br>ඊ. සේවක තෘප්තිය නිරීක්ෂණය කරනු ලැබේ.<br><br>උ. සේවක දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මකයි. | |
| **ආ 8 ප්‍රජා සේවා**<br><br>සංවිධානයේ ක්‍රියාකාරකම් අසල්වැසි ප්‍රජාවන්ට ආහාර, ජලය, බලශක්තිය, සෞඛ්‍ය සේවා හෝ සනීපාරක්ෂාව වැනි මූලික සේවාවන් සැපයීම අනතුරේ නොහෙළයි. | අ. සංවිධානය දේශීය සේවාවන් ලබා ගැනීම කෙරෙහි එහි බලපෑම නිරීක්ෂණය කරයි.<br><br>ආ. ප්‍රාදේශීයව වෙසෙන ප්‍රජාවන් සඳහා සන්නිවේදන/ප්‍රතිපෝෂණ/ දුක්ගැනවිලි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ.<br><br>ඇ. සංවිධානයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය ප්‍රජාවන්ට මූලික සේවාවන් ලබා ගැනීමේ යම් අඩුවීමක් සිදුවී තිබේ ද යන්න හඳුනාගෙන ඒවා ආමන්ත්‍රණය කිරීමට කටයුතු සලසනු ලැබේ. | |
| **ආ 9 ප්‍රාදේශීය ජීවනෝපායන්**<br><br>සංවිධානයේ ක්‍රියාකාරකම් ඉඩම් සහ ජලජ සම්පත් භාවිතය, මාර්ග අයිතිය, ප්‍රවාහනය සහ නිවාස ඇතුළු ජීවනෝපාය සඳහා වන ප්‍රාදේශීය ප්‍රවේශයට අහිතකර ලෙස නොබලපායි. | අ. සංවර්ධනය සහ මෙහෙයුම් පිළිබඳ තීරණ වලදී ජීවනෝපායන් සඳහා වන ප්‍රාදේශීය ප්‍රවේශය සලකා බලනු ලැබේ.<br><br>ආ. ප්‍රාදේශීය ජීවනෝපාය සඳහා ප්‍රවේශය අඩු වූ ඕනෑම අවස්ථාවක් වාර්තා කිරීමට ප්‍රාදේශීය ප්‍රජාවන් සඳහා සන්නිවේදන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. | |
| **ඇ කොටස: සංස්කෘතික උරුමයන් සඳහා උපරිම ප්‍රතිලාභ ලබා දීම සහ ඍණාත්මක බලපෑම් අවම කිරීම** | | |
| **ඇ 1 සංස්කෘතික අන්තර්ක්‍රියා**<br><br>අහිතකර බලපෑම් අවම කිරීම සහ දේශීය ප්‍රතිලාභ උපරිම කිරීම මෙන්ම සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ස්වදේශීය ප්‍රජාවන් වෙත සහ සංස්කෘතික හෝ ඓතිහාසික වශයෙන් සංවේදී ස්ථාන වෙත සංචාරය කිරීම කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සහ ජාතික යහ පරිචයන් සහ දේශීයව එකඟ වූ මගපෙන්වීම සංවිධානය අනුගමනය කරයි. | අ. සංස්කෘතික ස්ථාන සහ ස්වදේශික ප්‍රජාවන් වෙත සංචාරක චාරිකා සඳහා පවත්නා ජාත්‍යන්තර, ජාතික සහ දේශීය යහ පරිචයන් සහ මගපෙන්වීම පිළිබඳව දැනුවත් කිරීම සහ ඒවාට අනුකූල වීම සංවිධානය විසින් පෙන්නුම් කරනු ලබයි.<br><br>ආ. මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම සහ අවශ්‍ය පරිදි අමතර මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සහ ඒවාට එකඟ වීම සඳහා සංවිධානය ප්‍රජාවන්/ස්ථාන සමඟ කටයුතු කරයි.<br><br>ඇ. මාර්ගෝපදේශ ඵලදායී ලෙස භාවිතා කර සන්නිවේදනය කරනු ලැබේ.<br><br>ඈ ළමුන් සමඟ නුසුදුසු අන්තර්ක්‍රියා වළක්වා ගැනීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වේ. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ඇ 2 සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම**<br><br>සංවිධානය ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා අධ්‍යාත්මික වැදගත්කමක් ඇති දේශීය වස්තු, ස්ථාන සහ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දායක වන අතර ප්‍රදේශවාසීන් ඒවාට ප්‍රවේශ වීමට බාධා ඇති නොකරයි. | අ. සංවිධානය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය දායකත්වය ලබා දෙන අතර ඒවා සටහන් කර ගනී.<br><br>ආ. සංවිධානය සංස්කෘතික උරුමයන් සඳහා මුදල්මය නොවන හෝ වෙනත් ආකාරයේ සහය සපයයි.<br><br>ඇ. ස්ථාන වෙත ප්‍රදේශවාසීන්ට ප්‍රවේශ වීම සඳහා විධිවිධාන සලසා ඇත. | |
| **ඇ 3 සංස්කෘතිය සහ උරුමය ඉදිරිපත් කිරීම**<br><br>සංවිධානය ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වලට ගරු කරන අතර සාම්ප්‍රදායික සහ සමකාලීන දේශීය සංස්කෘතියේ සැබෑ අංග අගය කරමින් සංවිධානයේ මෙහෙයුම්, සැලසුම්, සැරසිලි, ආහාර පිසීම හෝ සාප්පු තුළට ඒවා ඇතුළත් කරයි. | අ. දේශීය කලා/ශිල්ප නිර්මාණ සහ ගෘහ භාණ්ඩ වලින් පිළිබිඹු වේ.<br><br>ආ. සජීවී සංස්කෘතික උරුමයන් සහ සම්ප්‍රදායන් ආහාර පිසීම, ප්‍රදර්ශන, සිදුවීම් සහ පිරිනමන වෙනත් සේවාවන්හි දක්නට ලැබේ.<br><br>ඇ. ප්‍රකාශන හිමිකම් සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම්වලට ගරුකරමින් පිළිපදින අතර ඒවාට අවශ්‍ය අවසර ලබාගෙන ඇත.<br><br>ඈ දේශීය සංස්කෘතික උරුමයන් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ප්‍රජාවගේ අදහස් විමසා ඇත. | |
| **ඇ 4 පුරාවස්තු**<br><br>දේශීය හා ජාත්‍යන්තර නීතියෙන් අවසර දී ඇති පරිදි මිස ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත භාණ්ඩ විකිණීම, වෙළඳාම් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සිදු නොකෙරේ. | අ. පුරාවස්තුවල ඕනෑම භාවිතයක් විනිවිදභාවයෙන් සහ/හෝ ලේඛනගත කර වාර්තා කර ඇත.<br><br>ආ. පුරා වස්තු භාවිතා කරන ස්ථානවල, එවැනි භාවිතයට අවසර දෙන නීති සහ අතුරු ව්‍යවස්ථා හඳුනාගෙන ඇත.<br><br>ඇ. පුරා වස්තු ඉවත් කිරීමට හෝ හානි කිරීමට සංචාරකයින්ට ඉඩ දෙනු නොලැබේ. | |
| **ඈ කොටස: පරිසරයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සහ ඍණාත්මක බලපෑම් අවම කිරීම** | | |
| **ඈ 1 සම්පත් සංරක්ෂණය කිරීම** | | |
| **ඈ 1.1 පරිසර හිතකාමී මිලදී ගැනීම්**<br><br>මිලදී ගැනීමේ ප්‍රතිපත්ති ප්‍රාග්ධන භාණ්ඩ, ආහාර, පාන වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය ඇතුළු පාරිසරික වශයෙන් තිරසර සැපයුම්කරුවන්ට සහ නිෂ්පාදනවලට අනුග්‍රහය දක්වයි. | අ. ලේඛනගත පාරිසරික මිලදී ගැනීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.<br><br>ආ. පාරිසරික සහතිකකරණයකින් යුක්ත නිෂ්පාදන සහ සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ - විශේෂයෙන් ලී, කඩදාසි, මාළු, වෙනත් ආහාර සහ වනයේ නිෂ්පාදන සම්බන්ධයෙන් මෙම ප්‍රමඛත්වය විශේෂිත වේ.<br><br>ඇ. සහතික කරන ලද නිෂ්පාදන සහ සැපයුම්කරුවන් නොමැති විට, නිෂ්පාදනය සිදුවන ස්ථානය සහ වගාකිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ක්‍රම සලකා බලනු ලැබේ.<br><br>ඈ. තර්ජනයට ලක් වූ විශේෂ භාවිතා කිරීම හෝ විකිණීම සිදු නොකෙරේ. | |
| **ඈ 1.2 කාර්යක්ෂම මිලදී ගැනීම**<br><br>අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ආහාර ඇතුළු පරිභෝජන සහ භාවිතයෙන් පසු ඉවත දැමිය හැකි භාණ්ඩ මිලදී ගැනීම සංවිධානය ප්‍රවේශමෙන් කළමනාකරණය කරයි. | අ. සංවිධානය නැවත භාවිත කළ හැකි, ආපසු භාර දිය හැකි සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි භාණ්ඩ මිලදී ගැනීම ප්‍රිය කරයි.<br><br>ආ. පරිභෝජන සහ ඉවත දැමිය හැකි භාණ්ඩ මිලදී ගැනීම සහ භාවිතය අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සිදුවේ.<br><br>ඇ. සුදුසු පරිදි තොග වශයෙන් මිලදී ගැනීම වැනි දෑ තුළින් අනවශ්‍ය ඇසුරුම් (විශේෂයෙන් ප්ලාස්ටික් වලින්) වළක්වනු ලැබේ. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ඈ 1.3 බලශක්ති සංරක්ෂණය**<br><br>බලශක්ති පරිභෝජනය භාවිතා කරනු ලබන බලශක්ති ඒවායේ වර්ගය අනුව ගණනය කරනු ලබන අතර සමස්ත පරිභෝජනය අවම කිරීමට පියවර ගනු ලැබේ. සංවිධානය පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීමට උත්සාහ දරයි. | අ. භාවිතා කරන මුළු බලශක්ති ප්‍රමාණය නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ආ. සංචාරකයෙකුට/රාත්‍රියකට භාවිතා කරනු ලබන එක් එක් වර්ගයේ බලශක්ති වර්ගය නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ඇ. පුනර්ජනනීය ප්‍රභවයන් සඳහා අනුග්‍රහය දක්වන අතර සම්පූර්ණ බලශක්ති සැපයුමේ පුනර්ජනනීය බලශක්තියේ කොටස නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ඈ බලශක්ති භාවිතය අවම කරන උපකරණ සහ භාවිතයන් යොදාගනී.<br><br>ඉ. බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා වන ඉලක්ක තිබේ.<br><br>ඊ. කාර්ය මණ්ඩලයට සහ අමුත්තන්ට බලශක්ති භාවිතය අවම කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දෙනු ලැබේ. | |
| **ඈ 1.4 ජල සංරක්ෂණය**<br><br>ජල අවදානම තක්සේරු කර, ජල පරිභෝජනය වර්ගය අනුව මනිනු ලබන අතර, සමස්ත පරිභෝජනය අවම කිරීමට පියවර ගනු ලැබේ. ජල මූලාශ්‍ර තිරසර වන අතර පාරිසරික ප්‍රවාහයන්ට අහිතකර ලෙස නොබලපායි. ඉහළ ජල අවදානම් සහිත ප්‍රදේශවල, සන්දර්භය මත පදනම් වූ ජල භාරකාරත්ව ඉලක්ක හඳුනාගෙන ඒවා අනුග මනය කරනු ලැබේ. | අ. ජල අවදානම තක්සේරු කර ලේඛනගත කර ඇත.<br><br>ආ. ජල අවදානම ඉහළ යැයි තක්සේරු කර ඇති විට, ජල භාරකාරත්ව ඉලක්ක නිර්ණය කර ඇත.<br><br>ඇ. එක් සංචාරකයකු/රාත්‍රියක මූලාශ්‍රය අනුව භාවිත කරන ජලය නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ඈ ජල පරිභෝජනය අවම කරන උපකරණ සහ භාවිතයන් භාවිතා වේ.<br><br>ඉ. ජලය ආරම්භ වන්නේ නීත්‍යානුකූල සහ තිරසර මූලාශ්‍රයකින් වන අතර එය පාරිසරික ප්‍රවාහයන්ට කලින් බල නොපා ඇති අතර අනාගතයේදී එය බලපානු ඇතැයි සිතිය නොහැක.<br><br>ඊ. ප්‍රදේශයේ ජල මූලාශ්‍ර මත සංචාරක ව්‍යාපාරය විසින් සිදුකරනු ලබන මුළු බලපෑම සලකා බලනු ලැබේ.<br><br>උ. ජල පරිභෝජනය අඩු කිරීම සඳහා ඉලක්ක තිබේ.<br><br>ඌ. කාර්ය මණ්ඩලයට සහ අමුත්තන්ට ජල භාවිතය අවම කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දෙනු ලැබේ. | |
| **ඈ කොටස: පරිසරයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම** | | |
| **ඈ 2 දූෂණය අඩු කිරීම** | | |
| **ඈ 2.1 හරිතාගාර වායු විමෝචනය**<br><br>සංවිධානය විසින් පාලනය කරනු ලබන සියලුම ප්‍රභවයන්ගෙන් සිදුවන සැලකිය යුතු හරිතාග ාර වායු විමෝචනය හඳුනාගෙන, හැකිතාක් ගණනය කර ඒවා වළක්වා ගැනීමට හෝ අවම කිරීමට ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කෙරේ. සංවිධානයේ ඉතිරි වායු විමෝචනය හිලව් කිරීම දිරිමත් කරනු ලැබේ.ග | අ. මුළු සෘජු හා වක්‍ර හරිතාගාර වායු විමෝචනය නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ආ. එක් සංචාරකයෙකුට/රාත්‍රියකට අදාල කාබන් පියසටහන් නිරීක්ෂණය කර කළමනාකරණය කෙරේ.<br><br>ඇ. සංවිධානය විසින් පාලනය කරනු ලබන සියලුම මූලාශ්‍රවලින් සිදුවන සැලකිය යුතු වාර්ෂික විමෝචනය වැළැක්වීමට සහ අවම කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br><br>ඈ. ප්‍රායෝගික සිදුකළ හැකි අවස්ථාවලදී කාබන් හිලව් කිරීමේ යාන්ත්‍රණ භාවිතා වේ. | |
| **ඈ 2.2 ප්‍රවාහනය**<br><br>සංවිධානය ප්‍රවාහන අවශ්‍යතා අඩු කිරීමට උත්සාහ කරන අතර පාරිභෝගිකයින්, සේවකයින්, සැපයුම්කරුවන් සහ තමන්ගේ මෙහෙයුම් වලදී පිරිසිදු හා වඩා සම්පත් කාර්යක්ෂම විකල්ප භාවිතා කිරීම ක්‍රියාකාරීව දිරිමත් කරයි. | අ. අප ජලය තිබෙන්නේ නම්, නාගරික හෝ රජයේ අනුමත පිරිපහදු පද්ධතියකට බැහැර කරනු ලැබේ.<br><br>ආ. සුදුසු නාගරික අප ජල පවිත්‍රකරණයක් නොමැති නම් ප්‍රාදේශීය ජනගහනයට සහ පරිසරයට අහිතකර බලපෑම් නොමැති බව තහවුරු කිරීම සඳහා පරිශ්‍රය තුල අප ජලය පිරිපහදු කිරීම සඳහා අපජල පවිත්‍රකරණ පද්ධතියක් (ජාත්‍යන්තර අපජල තත්ත්ව අවශ්‍යතා සපුරාලන) ඇත. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ඈ 2.3 අපජලය**<br><br>අළු ජලය ඇතුළු අපජල ජලය එලදායී ලෙස පිරිපහදු කරනු ලබන අතර දේශීය ජනගහනයට හෝ පරිසරයට අහිතකර බලපෑමක් නොමැතිව නැවත භාවිතා කිරීම හෝ ආරක්ෂිතව මුදා හැරීම පමණක් සිදුකෙරේ. | අ. අප ජලය නාගරික හෝ රජයේ අනුමත පිරිපහදු පද්ධතියක් තිබෙන්නේ නම් එයට බැහැර කරනු ලැබේ.<br><br>ආ. සුදුසු නාගරික අප ජල පවිත්‍රකරණයක් නොමැති නම් ප්‍රාදේශීය ජනගහනයට සහ පරිසරයට අහිතකර බලපෑම් නොමැති බව තහවුරු කිරීම සඳහා පරිශ්‍රය තුල අප ජලය පිරිපහදු කිරීම සඳහා අපජල පවිත්‍රකරණ පද්ධතියක් (ජාත්‍යන්තර අපජල තත්ත්ව අවශ්‍යතා සපුරාලන) ඇත. | |
| **ඈ 2.4 ඝන අපද්‍රව්‍ය**<br><br>ආහාර අපද්‍රව්‍ය ඇතුළු අපද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කොට අපද්‍රව්‍ය අවම කිරීමට යාන්ත්‍රණ ක්‍රියාත්මක වන අතර, ඒවා අවම කළ නොහැකි නම්, එය නැවත භාවිතා කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම. ඉතිරිවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය ප්‍රාදේශීය ජනගහනයට හෝ පරිසරයට අහිතකර බලපෑමක් නැත. | ඒ. එක් සංචාරකයෙකු/රාත්‍රියකට බැහැර කරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කොට කළමනාකරණය කෙරේ.<br><br>ආ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මකයි.<br><br>ඇ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මට ආහාර අපද්‍රව්‍ය අවම කිරීම, වෙන් කිරීම සහ නැවත භාවිතය හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් වේ.<br><br>ඈ අපද්‍රව්‍ය රජයේ හෝ අනුමත ස්ථානයකට බැහැර කරන අතර එම ස්ථානය පරිසරය හෝ දේශීය ජනගහනය මත ඍණාත්මක බලපෑමක් ඇති නොකරන බවට සාක්ෂි ඇත<br><br>ඉ. බැහැර කරන ඝන අපද්‍රව්‍ය  එම අපද්‍රව්‍ය වර්ගය අනුව ගණනය කරනු ලබන අතර වෙනස් කළ නොහැකි ඝන අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ඉලක්ක ඇත.<br><br>ඊ. අපද්‍රව්‍ය අවම කිරීම සඳහා පාරිභෝගිකයින්ට සහ කාර්ය මණ්ඩලයට මග පෙන්වීමක් ලබා දේ. | |
| **ඈ 2.5 හානිකර ද්‍රව්‍ය**<br><br>පළිබෝධනාශක, තීන්ත, පිහිනුම් තටාක විෂබීජ නාශක සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය ඇතුළු හානිකර ද්‍රව්‍ය භාවිතය අවම කර, හැකි සියළු අවස්ථාවලදී හානිකර නොවන නිෂ්පාදන හෝ ක්‍රියාවලි මගින් ආදේශ කරනු ලැබේ. රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම, භාවිතය, හැසිරවීම සහ බැහැර කිරීම සියල්ල නිසි ලෙස කළමනාකරණය කර ඇත. | අ. හානිකර ද්‍රව්‍ය පිලිබඳ ලේඛණයක් සාදා ඇති අතර ද්‍රව්‍ය ආරක්ෂණ දත්ත පත්‍රිකා (MSDS) සකසා තිබේ.<br><br>ආ. වඩාත් පරිසර හිතකාමී විකල්ප ලබා ගැනීමට කටයුතු කර ඇත.<br><br>ඇ. විශේෂයෙන් තොග ප්‍රමාණවලින් ඇති රසායනික ද්‍රව්‍ය ගබඩා කර ඇති අතර, එයට අදාල ප්‍රමිතීන්ට අනුකූලව හසුරුවනු ලැබේ.<br><br>ඉ. දේශීය පරිසරයට (හිරු එළියට නිරාවරණය වීමෙන් වැලකීම සඳහා භාවිතා කරන විෂ සහිත ද්‍රව්‍ය සහ විකර්ෂක වැනි) හානිකර යැයි සැලකිය හැකි ද්‍රව්‍යවල පුද්ගලික භාවිතය පිළිබඳව අමුත්තන්ට දැනුම් දෙනු ලැබේ. | |
| **ඈ 2.6 පරිසර දූෂණය අවම කිරීම**<br><br>ශබ්දය, ආලෝකය, ගලා යාම, ඛාදනය, ඕසෝන් ක්ෂය කරන ද්‍රව්‍ය සහ වාතය, ජලය සහ පාංශු දූෂක ද්‍රව්‍ය වලින් සිදුවන දූෂණය අවම කිරීම සඳහා සංවිධානය කටයුතු කරයි. | අ. නිර්ණායකයෙන් ආවරණය වන දූෂණ සිදුවිය හැකි  මූලාශ්‍ර සමාලෝචනය කර හඳුනාගෙන ඇත.<br><br>ආ. නිර්ණායකයෙන් ආවරණය වන දූෂණය සිදුවිය හැකි මූලාශ්‍ර අධීක්ෂණයට ලක් කෙරේ.<br><br>ඇ. නිර්ණායකයෙන් ආවරණය වන මූලාශ්‍රයන්ගෙන් සිදුවන දූෂණය අවම කිරීමට සහ හැකිතාක් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ඈ කොටසඃ පරිසරයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සහ සෘණාත්මක බලපෑම් අවම කිරීම** | | |
| **ඈ 3 ජෛව විවිධත්වය, පරිසර පද්ධති සහ භූ දර්ශන සංරක්ෂණය කිරීම** | | |
| **ඈ 3.1 ජෛව විවිධත්ව සංරක්ෂණය**<br><br>සංවිධානය තම දේපළ නිසි ලෙස කළමනාකරණය කිරීම ඇතුළුව ජෛව විවිධත්ව සංරක්ෂණයට සහය දක්වයි. ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශ සහ ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. ස්වාභාවික පරිසර පද්ධතිවලට යම් බාධාවක් තිබෙන්නේ නම් එය අවම කර, පුනරුත්ථාපනය කර, සංරක්ෂණ කළමනාකරණය සඳහා දායකත්ව වන්දි ගෙවීමක් ඇත. | අ. සංවිධානය ස්වභාවික ආරක්ෂිත ප්‍රදේශ සහ ඉහළ ජෛව විවිධත්ව වටිනාකමක් ඇති ප්‍රදේශ පිළිබඳ දැනුවත්භාවය පෙන්නුම් කරයි.<br><br>ආ. සංවිධානය ප්‍රදේශයේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා මූල්‍යමය සහාය ලබා දෙන අතර ඒ පිළිබඳ වාර්තා තබාගනී.<br><br>ඇ. සංවිධානය ප්‍රදේශයේ ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා මූල්‍යමය නොවන හෝ වෙනත් සහය ලබා දෙයි.<br><br>ඈ ජෛව විවිධත්ව සංරක්ෂණයට සහාය වීම සඳහා දේපල සක්‍රියව කළමනාකරණය කරයි.<br><br>ඉ. සංවිධානය වන සතුන්ට සහ වාසස්ථානවලට බාධා ඇති වීමේ හැකියාවක් ඇති ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත්වී ඇති අතර එය අවම කිරීම සඳහා සක්‍රියව කටයුතු කරයි.<br><br>ඊ. කිසියම් බාධාවක් සිදු වූ විට වන්දි ලබා දෙනු ලැබේ.<br><br>උ. ජෛව විවිධත්ව සංරක්ෂණයට සහාය වීම සඳහා අමුත්තන් දිරිමත් කිරීමට පියවර ගනු ලැබේ.<br><br>ඌ. සංවිධානය සංරක්ෂණ සඳහා කටයුතු කරන දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වේ. | |
| **ඈ 3.2 ආක්‍රමණශීලී විශේෂ**<br><br>ආක්‍රමණශීලී විශේෂ හඳුන්වා දීම වැළැක්වීම සඳහා සංවිධානය පියවර ගනී. විශේෂයෙන්ම ස්වභාවික භූ දර්ශන තුළ, හැකි සෑම තැනකම භූමි අලංකරණය සහ පුනස්ථාපනය සඳහා දේශීය විශේෂ භාවිතා කරනු ලැබේ. | අ. යම් ආක්‍රමණශීලී විශේෂයක් තිබේදැයි ස්ථානය නිරීක්ෂණය කෙරේ.<br><br>ආ. ආක්‍රමණශීලී විශේෂ හඳුන්වාදීම හෝ ව්‍යාප්ත නොවීම සහතික කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br><br>ඇ. ආක්‍රමණශීලී විශේෂ තුරන් කිරීම සහ පාලනය කිරීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මකයි.<br><br>ඈ දේශීය විශේෂ භාවිතය සලකා බැලීම සඳහා ස්ථාන වල භූමි අලංකරණය සමාලෝචනය කෙරේ. | |
| **ඈ 3.3 ස්වභාවික ස්ථාන නැරඹීම**<br><br>අහිතකර බලපෑම් අවම කිරීම සහ නරඹන්නන්ගේ තෘප්තිය උපරිම කිරීම සඳහා ස්වභාවික ස්ථාන නැරඹීම කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානය සුදුසු මාර්ගෝපදේශ අනුගමනය කරයි. | අ. සංවිධානය ස්වභාවික ස්ථාන වෙත සංචාරක පැමිණීම් සඳහා පවතින මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත්ව සිටින අතර ඒවාට අනුකූලව කටයුතු කරයි.<br><br>ආ. සංචාරයන් සංවිධානය කිරීමේ දී සහ සංචාරකයින්ට තොරතුරු ලබා දීමේ දී මාර්ගෝපදේශ භාවිතා වේ.<br><br>ඇ. සංවිධානය විශේෂිත ස්ථාන වෙත පැමිණීම සම්බන්ධ ගැටළු තහවුරු කර ගැනීමට/හඳුනා ගැනීමට ප්‍රාදේශීය සංරක්ෂණ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. | |

| නිර්ණායක | දර්ශක | පවතින බව |
|---|---|---|
| **ඈ 3.4 වනජීවී අන්තර්ක්‍රියා**<br><br>සමුච්චිත බලපෑම් සැලකිල්ලට ගනිමින් ආක්‍රමණශීලී නොවන නිදහසේ සැරිසරන වනජීවීන් සමඟ අන්තර්ක්‍රියා කරන අතර අදාළ සතුන්ට සහ වනයේ ජෛවගහනයේ ජීව්‍යතාව සහ හැසිරීම් කෙරෙහි අහිතකර බලපෑම් වළක්වා ගැනීමට වගකීමෙන් යුතුව කළමනාකරණය කරයි | අ. වනජීවීන් නැරඹීම ඇතුළු වනජීවී අන්තර්ක්‍රියා සම්බන්ධයෙන් පවතින දේශීය, ජාතික සහ ජාත්‍යන්තර රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව සංවිධානය දැනුවත්ව සිටින අතර ඒවාට අනුකූල වේ.<br><br>ආ. වනජීවී විශේෂඥයින්ගේ උපදෙස් මත අවශ්‍ය පරිදි වනජීවීන් නැරඹීම ඇතුළු වනජීවී අන්තර්ක්‍රියා සඳහා දේශීය නීති සංග්‍රහ සහ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානය නිරත වේ.<br><br>ඇ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් මගින් නිශ්චිතව අනුමත කර නොමැති නම් හෝ ප්‍රමිතීන් නොමැති තත්වයක් තුළ ස්වාධීන වනජීවී විශේෂඥ උපදෙස් මගින් මඟ පෙන්වනු ලබන්නේ නම් මිස, විශේෂයෙන්ම ආහාර සැපයීමේදී සෘජු අන්තර්ක්‍රියාවලට ඉඩ නොදිය යුතුය.<br><br>ඈ වන සතුන්ට සිදුවන කරදර අවම කිරීමට පියවර ගැනේ.<br><br>ඉ. වනජීවී යහපැවැත්ම සඳහා වන බලපෑම් නිරන්තරයෙන් අධීක්ෂණය කොට අවධානය යොමු කෙරේ. | |
| **ඈ 3.5 සත්ව සුභසාධනය**<br><br>බලයලත් සහ සුදුසු ලෙස සන්නද්ධ පුද්ගලයන් විසින් සහ දේශීය හා ජාත්‍යන්තර නීතියට අනුකූලව නිසි ලෙස නියාමනය කරන ලද ක්‍රියාකාරකම් සඳහා හැර, කිසිදු වන සත්ව විශේෂයක් අත්පත් කර ගැනීම, අභිජනනය කිරීම හෝ තම සතුව රඳවා තබා ගැනීම සිදු නොවේ.<br><br>සියලුම වන සතුන් සහ ගෘහස්ථ සතුන් සඳහා වාසස්ථාන සැපයීම, රැකවරණය සහ හැසිරවීම යනාදියේ දී සත්ව සුභසාධනයේ ඉහළම ප්‍රමිතීන් සපුරාලයි. | අ. රඳවා ගැනීමට පත් වන සතුන් සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිබඳව සංවිධානය දැනුවත්ව සහ ඒවාට අනුකූල වේ.<br><br>ඕ. රඳවා ගැනීමට පත් වන සම්බන්ධ විශේෂිත සංචාරක ක්‍රියාකාරකම් සඳහා පවතින මාර්ගෝපදේශ ක්‍රියාත්මක කෙරේ.<br><br>ඇ. රඳවා ගැනීමට පත් වන සතුන් සඳහා වගකිව යුතු පුද්ගලයින්ට අදාල සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අතර බලපත්‍ර ලබා ඇත.<br><br>ඈ සංවිධානය සත්ව සුභසාධනය සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිබඳව දැනුවත්ව සිටින අතර සංවිධානය ඒවාට අනුකූල වේ.<br><br>ඉ. රඳවා ගැනීමට පත් වන සතුන්ගේ තත්වයන් සහ ඔවුන්ගේ වාසස්ථාන පිළිබඳ නිරන්තර පරීක්ෂාව පවතී.<br><br>ඊ. ගෘහස්ථ සතුන් සහ ඔවුන්ගේ වාසස්ථාන සහ හැසිරවීම තත්ත්වයන් පිළිබඳ නිරන්තර පරීක්ෂාව පවතී | |
| **ඈ 3.6 වනසතුන් මරණයට පත් කිරීම (අස්වනු නෙලීම) සහ වෙළඳාම**<br><br>වනසතුන් මරණයට පත්කිරීම, පරිභෝජනය කිරීම, ප්‍රදර්ශනය කිරීම, විකිණීම හෝ වෙළඳාම් කිරීම ඔවුන්ගේ භාවිතයේ තිරසර බව රැකෙන අයුරින් සහ දේශීය හා ජාත්‍යන්තර නීතිවලට අනුකූල වන අයුරින් සිදුකරනු ලබන බව සහතික කරනු ලබන නියාමනය කරන ලද ක්‍රියාකාරකමක කොටසක් ලෙස හැර අන් අයුරකින් සිදුනොවේ. | අ. වනජීවී අස්වනු නෙලීම සහ වෙළඳාම සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිබඳව සංවිධානය දැනුවත්ව සිටින අතර ඒවාට අනුකූල වන අයුරින් කටයුතු කරයි.<br><br>ආ. වනජීවී අස්වනු නෙලීම, පරිභෝජනය සහ වෙළඳාම සම්බන්ධ රෙගුලාසි සහ IUCN හෝ CITES විසින් දැනුවත් කර ඇති තර්ජනයට ලක්ව ඇති වනජීවී විශේෂවලින් ලබාගත් නීති විරෝධී නිෂ්පාදන/සිහිවටන මිලදී ගැනීමෙන් වැළකීමේ අවශ්‍යතාවය පිළිබඳව සංචාරකයින්ට දැනුම් දෙනු ලැබේ.<br><br>ඇ. දඩයම් ක්‍රියාකාරකම් නීත්‍යානුකූල වන විට, එය සංරක්ෂණය සඳහා විද්‍යාත්මකව පදනම් වූ, නිසි ලෙස කළමනාකරණය කරන ලද සහ දැඩි ලෙස බලාත්මක කරන ලද ප්‍රවේශයක කොටසකි. | |

» GSTC මගින් විශේෂිත පුහුණුවක් ලබා ඇති සුදුසුකම් ලත් SLTDA හි විගණක කණ්ඩායමක් විසින් විගණන සිදු කරනු ලැබේ.

» එක් එක් නිර්ණායක සඳහා පිළිගත හැකි සාක්ෂි සහිතව ඔබේ හිමිකම් පෑම තහවුරු කර ගැනීම සඳහා විගණක කණ්ඩායමට සහාය වීමට ඔබේ පූර්ණ සහයෝගය SLTDA ඉල්ලා සිටී.

» ආයතනයේ ප්‍රධානියා (උදා: සාමාන්‍යාධිකාරී) සහ එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ කණ්ඩායම සමඟ රැස්වීමකින් (පූර්ව විස්තර කිරීමකින්) විගණනය ආරම්භ කෙරේ. මෙම රැස්වීම සඳහා අමතරව සහභාගි කරවීමට සැලස්විය යුත්තේ කවුරුන්ද යන්න ඔබට තීරණය කළ හැකිය (උදා: තිරසර නිලධාරී, කාර්ය මණ්ඩල සුබසාධන සංගමයේ සභාපති වැනි)

» සාක්ෂියක් ලෙස කණ්ඩායම විසින් ඡායාරූප ගන්නා අතර ශ්‍රව්‍ය සහ/හෝ දෘශ්‍ය පටිගත කිරීමද සිදු කළ හැකි බව කරුණාවෙන් සලකන්න. එම සාක්ෂිවල රහස්‍යභාවය ආරක්ෂා කරන බවත් එම ද්‍රව්‍ය NSTC සහතිකකරණ අරමුණ සඳහා පමණක් භාවිත කරන බවත් SLTDA සහතික කරයි.

» විගණක කණ්ඩායමට ඕනෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සමඟ තනි තනිව සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ අයිතිය ඇති අතර අවට ප්‍රජාව, සැපයුම්කරුවන්, සංචාරකයින් ආදීන්ගෙන් විමසීම් කළ හැකිය.

» සහතික කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් සහ බාධා කිරීම් වලක්වා ගැනීම සඳහා පහත ලේඛන ඔබ සතුව ඇති බවට තහවුරු කර ගන්නා ලෙස SLTDA ඉල්ලා සිටී. මෙම ලේඛන ඉහත දක්වා ඇති සමහර නිර්ණායකවලට අදාළ වේ.

- සංවිධානයේ තිරසර ප්‍රතිපත්තිය/ උපාය මාර්ගය
- පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL)
- UDA විසින් අනුමත ගොඩනැගිලි සැලැස්ම
- අනුකූලතා සහතිකය
- SLTDA බලපත්‍රය
- අධ්‍යයනය කර ඇති හෝටලයට විශේෂිත බලපෑම් තක්සේරුව
- සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ නීතිවලට අදාල යාවත්කාලීන කරන ලද ලැයිස්තුව
- සියලුම අදාළ නීතිමය අවශ්‍යතාවලට අනුකූල බව පෙන්වන සහතික, බලපත්‍ර, අවසර පත්‍ර හෝ වෙනත් ලේඛනමය සාක්ෂි
- ඉඩම් හිමිකම සහ ඉඩම් භුක්තිය හා සම්බන්ධ අයිතිය සඳහන් වන ලියකියවිලි
- ඉඩම්, සහ ජලය, විදුලිය ඇතුළු ප්‍රධාන සම්පත් සඳහා නීත්‍යානුකූල අයිතිවාසිකම් සඳහන් වන ලියකියවිලි
- තිරසරභාවය පිළිබඳ පුහුණුවීම්වල පැමිණීමේ ලැයිස්තුව
- තිරසරභාවය පිළිබඳ විෂයයන් සඳහා අදාළ කාර්ය මණ්ඩලයේ සුදුසුකම් සහ සහතික
- පාරිභෝගික පැමිණිලි සඳහා සාක්ෂි සහ පාරිභෝගික පැමිණිලි හා සම්බන්ධ නිවැරදි කරගැනීමේ ක්‍රියාමාර්ග
- තිරසරභාවය පිළිබඳ හිමිකම් පෑම හා සම්බන්ධ ප්‍රවර්ධන ද්‍රව්‍ය
- ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා කරන ලද දායකත්වය පිළිබඳ වාර්තා
- (තිබේ නම්) දේශීය ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය
- දේශීය ව්‍යවසායකයින් සමඟ හවුල් ව්‍යාපාර හෝ හවුල්කාරිත්-වය පිළිබඳ සාක්ෂි
- සූරාකෑමට හා හිරිහැරවලට එරෙහි ප්‍රතිපත්තිය
- රැකියා ප්‍රතිපත්තිය
- කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ලබා දෙන ලද සාමාන්‍ය පුහුණුවීම් පිළිබඳ සාක්ෂි සහ පුහුණු කාලසටහන් පිළිබඳ තොරතුරු
- කාර්ය මණ්ඩලය සඳහා සමාජ ආරක්ෂාව ඇති බවට සාක්ෂි
- සංචාරකයින්/අමුත්තන් සඳහා විශේෂයෙන් සංස්කෘතික ස්ථාන සහ ස්වභාවික ස්ථාන සහ වන සතුන් නැරඹීම සඳහා වන මාර්ගෝපදේශ
- සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමට දායක වූ බවට සාක්ෂි
- පරිසර හිතකාමී මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය
- පරිභෝජනය අඩු කිරීමේ ඉලක්ක සහිත ජල පරිභෝජන වාර්තා/ ජල තත්ත්ව වාර්තා
- විදුලි පරිභෝජන වාර්තා
- කාබන් පියසටහන් පිළිබඳ වාර්තා
- අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සහ හානිකර ද්‍රව්‍ය/MSDs විස්තර ලේඛණය
- ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා මුදල්මය නොවන හෝ වෙනත් ආකාරයේ සහය පිළිබඳ වාර්තා

# 11. ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය

මිණුම් ලකුණට ඉහළින් ලැබෙන ලකුණු මත පදනම්ව, GSTC විසින් නිර්දේශ කරනු ලබන මට්ටම් හතරක් යටතේ සහතිකය ප්‍රදානය කෙරේ.

- 50%-59%: සහතිකය
- 60% - 69%: ලෝකඩ
- 70% - 79%: රිදී
- 80% - 89%: රන්
- 90 ට වැඩි: ප්ලැටිනම්



# 12. වලංගුභාවය සහ අලුත් කිරීම

ජාතික තිරසර සංචාරක සේවා සහතිකය (NSTC) සහතික කළ දින සිට වසර දෙකක කාලයක් සඳහා වලංගු වේ. මෙම කාලයෙන් පසු, නවාතැන් විසින් ඔවුන්ගේ සහතිකය අලුත් කිරීම සඳහා නැවත අයදුම් කර සහතික කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ නැවත සහතිකකරණය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ



# තොරතුරු මූලාශ්‍ර


Global Sustainable Tourism Council (GSTC) (2022) GSTC පහත ක්‍රමයෙන් ප්‍රවේශ විය හැකිය: https://www.gstcouncil.org/ / (ප්‍රවේශය: දෙසැම්බර් 2, 2022).

සංචාරක උපායමාර්ගික සැලැස්ම (දිනයක් නොමැත). පහත ක්‍රමයෙන් ප්‍රවේශ විය හැකිය: https://storage.googleapis.com/sltda-cdn/tourism-strategic-plan-2017-to-2020.pdf (ප්‍රවේශය: දෙසැම්බර් 2, 2022).

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (2018) NSTC ව්‍යාපෘති ලේඛනය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (2018) ජාතික තිරසර සංචාරක සහතිකකරණය (අත්පොත). SLTDA.

Naturefriends International (2012). සංචාරක ව්‍යාපාරයේ තිරසරත්වය: Label Jungle හරහා මාර්ගෝපදේශයක්: VIenna

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) (2005) සංචාරක ව්‍යාපාරය වඩාත් තිරසර කිරීම: ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මාර්ගෝපදේශයකි. පහත ක්‍රමයෙන් ප්‍රවේශ විය හැකිය: https://wedocs.unep.org/20.500.11822/8741 (ප්‍රවේශය: 2 දෙසැම්බර් 2022)